සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**
**இலங்கைப் பரீட்சைத் திணைக்களம்**
**Department of Examinations, Sri Lanka**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2022(2023)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2022(2023)
General Certificate of Education (Adv. Level) Examination, 2022(2023)

| | | | |
|---|---|---|---|
| ගිණුම්කරණය I<br>கணக்கீடு I<br>Accounting I | 33 | S | I |

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
*Two hours*

**උපදෙස්:**

* **සියලුම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* අංක **1** සිට **30** තෙක් වූ ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු තෝරා **එහි අංකය ප්‍රශ්නයට ඉදිරියෙන් ඇති තිත් ඉර මත ලියන්න.**
* අංක **31** සිට **50** තෙක් වූ ප්‍රශ්නවලට කෙටි පිළිතුරු **අදාළ තිත් ඉරි මත ලියන්න.**
* සෑම ප්‍රශ්නයකටම **සමාන** ලකුණු හිමි වේ.
* **විභාග අංකය,** ඉහළින් ඇති කොටුවේ පැහැදිලි ව සටහන් කරන්න.
* **වැඩසටහන් සම්පාදනය කළ නොහැකි ගණක යන්ත්‍ර භාවිතයට අවසර දෙනු ලැබේ.**

විභාග අංකය : .................................

**පරීක්ෂකගේ ප්‍රයෝජනය සඳහා පමණි.**

| | අත්සන | සංකේත අංක |
|---|---|---|
| 1 වන පරීක්ෂක | | |
| 2 වන පරීක්ෂක | | |
| අති.ප්‍රධාන පරීක්ෂක | | |
| ගණිත පරීක්ෂක | | |
| ප්‍රධාන පරීක්ෂක | | |

| I පත්‍රය සඳහා | |
|---|---|
| ප්‍රශ්න අංකය | ලකුණු |
| 01 - 30 | |
| 31 - 50 | |
| එකතුව | |

**1.** පහත දැක්වෙන කුමන ප්‍රකාශය, ආයතනයක මූල්‍ය ගිණුම්කරණයේ මූලික පරමාර්ථය **වඩාත් හොඳින්** විස්තර කරනු ලබයි ද?
(1) නෛතික අවශ්‍යතා සපුරාලීම සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම.
(2) සෑම කාලච්ඡේදයකම ගනුදෙනු ගිණුම් පොත්වල සටහන් කිරීම.
(3) ගනුදෙනු සහ සිද්ධි මූල්‍ය තොරතුරු බවට පරිවර්තනය කිරීම.
(4) සැලසුම් කිරීම සහ පාලනය සඳහා කළමනාකරුවන්ට තොරතුරු සැපයීම.
(5) බාහිර ඇල්මැති පාර්ශ්වයන්ට තීරණ ගැනීම සඳහා තොරතුරු සැපයීම. (.....)

**2.** ආයතනයක ව්‍යාපාර කටයුතු හේතුවෙන් වායු දූෂණය වීම මූල්‍ය ප්‍රකාශනවල **හඳුනා නොගැනීමට** පහත කුමන ගිණුම්කරණ සංකල්පය හේතු වන්නේ ද?
(1) උපචිත (2) මූල්‍ය මිනුම් (3) ප්‍රමාණාත්මක බව
(4) විචක්ෂණ (5) ගැළපුම් (......)

**3.** ආයතනයක වර්ෂ අවසානයේදී අඩමාණ ණය වෙන් කිරීම සඳහා පහත කුමන ගිණුම්කරණ සංකල්ප **පදනම** සපයනු ලබයි ද?
(1) උපචිත සහ ප්‍රමාණාත්මක බව (2) ව්‍යාපාර ඒකක සහ යථාරූපී (3) ගැළපුම් සහ විචක්ෂණ
(4) කාලච්ඡේද සහ සංගතතා (5) විචක්ෂණ සහ මූල්‍ය මිනුම් (......)

● **අංක 4 සහ 5 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිත කරන්න.**

සීමිත මිහිරානි පොදු සමාගම මෝටර් රථ වෙළෙඳ සමාගමකි. මෙම සමාගම විසින් රු.මිලියන 10 ක මෝටර් රථ 2022.01.01 දින ණයට මිල දී ගන්නා ලද අතර, එයින් පිරිවැය රු.මිලියන 2 ක් වූ මෝටර් රථයක් කාර්යාල කටයුතු සඳහා තබාගන්නා ලදී. 2022.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මෙම මෝටර් රථයේ ක්ෂය රු. 100 000 ක් විය. ඉතිරි මෝටර් රථ අලෙවි කිරීම සඳහා තබාගන්නා ලද අතර, ඉන් පිරිවැය රු.මිලියන 3 ක් වූ මෝටර් රථයක්, රු.මිලියන 4 කට 2022.03.31 දින අත්පිට මුදලට විකුණන ලදී.

**4.** මෝටර් රථ මිල දී ගැනීම සහ මෝටර් රථය විකිණීම සටහන් කිරීම සඳහා පහත කුමන මූලික සටහන් පොත් භාවිත කරනු ලබයි ද?

| | **මිල දී ගැනීම** | **විකිණීම** |
|---|---|---|
| (1) | පොදු ජර්නලය | මුදල් ලැබීම් ජර්නලය |
| (2) | මුදල් ගෙවීම් ජර්නලය | පොදු ජර්නලය |
| (3) | ගැනුම් ජර්නලය | විකුණුම් ජර්නලය |
| (4) | මුදල් ගෙවීම් ජර්නලය සහ පොදු ජර්නලය | විකුණුම් ජර්නලය සහ පොදු ජර්නලය |
| (5) | ගැනුම් ජර්නලය සහ පොදු ජර්නලය | මුදල් ලැබීම් ජර්නලය |

(......)

**5.** 2022.03.31 දිනට ඉහත සඳහන් සියලු ගනුදෙනුවල **ශුද්ධ බලපෑම** පහත කුමන ගිණුම්කරණ සමීකරණයෙන් පෙන්වනු ලබයි ද?

| | ජංගම නොවන වත්කම් (රු.'000) | + | ජංගම වත්කම් (රු.'000) | = | වගකීම් (රු.'000) | + | හිමිකම (රු.'000) |
|---|---|---|---|---|---|---|---|
| (1) | + 1 600 | | + 9 000 | | + 10 000 | | + 600 |
| (2) | + 1 900 | | + 9 000 | | + 10 000 | | + 900 |
| (3) | + 2 000 | | + 9 000 | | + 10 000 | | + 1 000 |
| (4) | + 6 650 | | + 4 000 | | + 10 000 | | + 650 |
| (5) | + 7 000 | | + 4 000 | | + 10 000 | | + 1 000 |

(……)

● **අංක 6 සහ 7 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිත කරන්න.**

එකතු කළ අගය මත බදු (VAT) සඳහා ලියාපදිංචි සීමිත අමල් සමාගම 2022.03.15 දින රු. 672 000 ක භාණ්ඩ සුනිමල් ට්‍රේඩර්ස් වෙත ණයට විකුණන ලදී. මෙම ඉන්වොයිස් අගය තුළ 12% ක VAT ඇතුළත් වේ. පළුදුවීම් හේතුවෙන් ඉන්වොයිස් අගය රු. 84 000 ක් වූ භාණ්ඩ සුනිමල් ට්‍රේඩර්ස් විසින් ආපසු එවන ලදී. සීමිත අමල් සමාගම වෙත ගෙවිය යුතු මුළු මුදල පියවීමට 2022.03.31 දින සුනිමල් ට්‍රේඩර්ස් විසින් චෙක්පතක් නිකුත් කරන ලදී.

**6.** ඉහත සඳහන් සියලු ගනුදෙනු ඒවා සිදු වූ අනුපිළිවෙළ අනුව **සීමිත අමල් සමාගමේ** පොත්වල සටහන් කිරීම සඳහා භාවිත කරනු ලබන මූලාශ්‍ර ලේඛන:

(1) ඉන්වොයිසිය, හරපත, ලදුපත
(2) ඉන්වොයිසිය, බැරපත, ලදුපත
(3) ඉන්වොයිසිය, හරපත, තැන්පතු තුණ්ඩුව
(4) ඉන්වොයිසිය, බැරපත, ගෙවීම් වවුචරය
(5) ජර්නල් වවුචරය, බැරපත, ලදුපත (……)

**7.** 2022.03.15 දින විකුණන ලද භාණ්ඩ **සීමිත අමල් සමාගමේ** පොත්වල සටහන් කිරීමට අදාළ නිවැරදි ද්විත්ව සටහන:

| | ගිණුම් | හර (රු.'000) | බැර (රු.'000) |
|---|---|---|---|
| (1) | ණයගැති පාලන ගිණුම | 600 | |
| | විකුණුම් ගිණුම | | 600 |
| (2) | ණයගැති පාලන ගිණුම | 672 | |
| | විකුණුම් ගිණුම | | 672 |
| (3) | ණයගැති පාලන ගිණුම | 600 | |
| | VAT පාලන ගිණුම | 72 | |
| | විකුණුම් ගිණුම | | 672 |
| (4) | ණයගැති පාලන ගිණුම | 672 | |
| | විකුණුම් ගිණුම | | 600 |
| | VAT පාලන ගිණුම | | 72 |
| (5) | ණයගැති පාලන ගිණුම | 588 | |
| | විකුණුම් ගිණුම | | 525 |
| | VAT පාලන ගිණුම | | 63 |

(……)

● **අංක 8 සහ 9 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිත කරන්න.**

2022.03.31 දිනට රාමා ට්‍රේඩර්ස්හි ශේෂ පිරික්සුම තුලනය නොවූ අතර, එම වෙනස අවිනිශ්චිත ගිණුමකට බැර කරන ලදී. පසුව කරන ලද විමර්ශනයේදී පහත වැරදි අනාවරණය විය.

A - විදුලි වියදම් සඳහා ගෙවූ රු. 100 000 ක් මුදල් ගිණුමේ නිවැරදිව සටහන් කර ඇති නමුත්, එය විදුලි වියදම් ගිණුමට පිටපත් කර නොතිබුණි.

B - මුදල් ලැබීම් ජර්නලයේ දුන් වට්ටම් තීරුවේ එකතුව වූ රු. 30 000, බොල් ණය ලෙස හඳුනාගෙන තිබුණි.

C - ගැනුම් ජර්නලයේ එකතුව රු. 800 000 ක් ගැනුම් ගිණුමේ නිවැරදිව සටහන් කර තිබූ නමුත් එය ණයහිමි පාලන ගිණුමට රු. 80 000 ක් ලෙස බැර කර තිබුණි.

D - 2022 මාර්තු මාසය තුළදී ණයගැතියන්ගෙන් ලද මුළු මුදල වන රු. 150 000 ක් මුදල් ගිණුමට නිවැරදිව පිටපත් කර තිබුණ ද, වැරදීමකින් එය ණයහිමි පාලන ගිණුමට හර කර තිබුණි.

**8.** ඉහත කුමන වැරදි අවිනිශ්චිත ගිණුමේ ශේෂයක් ඇති වීමට හේතු වී තිබේ ද?

(1) A හා C පමණි. (2) C හා D පමණි. (3) A, C හා D පමණි.
(4) B, C හා D පමණි. (5) A, B, C හා D යන සියල්ලම ය. (……)

[තුන්වැනි පිටුව බලන්න.

**9.** ඉහත වැරදි නිවැරදි කළ පසුව, 2022.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ශුද්ධ ලාභයේ **අඩුවීම** සහ එම වැරදි නිවැරදි කිරීමට පෙර අවිනිශ්චිත ගිණුමේ ශේෂය:

| | ශුද්ධ ලාභය අඩුවීම (රු.' 000) | අවිනිශ්චිත ගිණුමේ බැර ශේෂය (රු.' 000) |
|---|---|---|
| (1) | 100 | 200 |
| (2) | 100 | 920 |
| (3) | 100 | 1 070 |
| (4) | 820 | 920 |
| (5) | 820 | 1 070 |

(......)

063123

**10.** කේවල ස්වාමි ව්‍යාපාරයක් වන දිල්රුක්ෂි ට්‍රේඩර්ස්, 2022.03.31 දිනෙන් අවසන් වර්ෂය තුළදී රු. 58 000 ක තොග පරිත්‍යාග කර ඇත. කෙසේ වුව ද, මෙම පරිත්‍යාගය සම්බන්ධයෙන් කිසිදු ගැළපීමක් ගිණුම් පොත්වල සිදුකර නොමැත. 2022.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී භෞතික තොගය මත, අවසාන තොගය ආගණනය කර ඇත.

මෙම තොග පරිත්‍යාගය ගිණුම් පොත්වල නිවැරදිව ගළපා තිබුනේ නම්, ව්‍යාපාරයේ දළ ලාභයට සහ ශුද්ධ ලාභයට ඇතිවන බලපෑම:

| | දළ ලාභය | ශුද්ධ ලාභය |
|---|---|---|
| (1) | රු. 58 000 කින් වැඩි වේ. | බලපෑමක් නොවේ. |
| (2) | රු. 58 000 කින් වැඩි වේ. | රු. 58 000 කින් අඩු වේ. |
| (3) | බලපෑමක් නොවේ. | රු. 58 000 කින් වැඩි වේ. |
| (4) | රු. 58 000 කින් අඩු වේ. | බලපෑමක් නොවේ. |
| (5) | රු. 58 000 කින් අඩු වේ. | රු. 58 000 කින් අඩු වේ. |

(......)

**11.** පහත තොරතුරු අනුරාධා ඇඟලුම් නිෂ්පාදන සමාගමේ ගිණුම් වාර්තාවලින් උපුටා ගන්නා ලදී.

| | රු.' 000 |
|---|---|
| 2021.04.01 දිනට අමුද්‍රව්‍ය තොගය | 2 000 |
| අමුද්‍රව්‍ය ගැනුම් | 29 000 |
| පරිභෝජනය කරන ලද අමුද්‍රව්‍ය පිරිවැය | 26 000 |
| නිෂ්පාදන සේවකයන්ගේ වේතන | 42 000 |
| ව්‍යාපාරයේ ගොඩනැගිලි කුලී වියදම් | 20 000 |
| යන්ත්‍ර ක්ෂය | 6 000 |

කර්මාන්තශාලාව සහ පරිපාලන කාර්යාලය සඳහා එකම ගොඩනැගිල්ල භාවිත කෙරේ. ගොඩනැගිල්ලේ මුළු බිම් ප්‍රමාණයෙන් 80% ක් කර්මාන්තශාලාව සඳහා භාවිත කරනු ලබයි.

2022.03.31 දිනට අමුද්‍රව්‍ය තොගය සහ 2022.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුළු නිෂ්පාදන පිරිවැය කොපමණ ද?

| | අමුද්‍රව්‍ය තොගය (රු.'000) | මුළු නිෂ්පාදන පිරිවැය (රු.'000) |
|---|---|---|
| (1) | 1 000 | 93 000 |
| (2) | 3 000 | 90 000 |
| (3) | 3 000 | 93 000 |
| (4) | 5 000 | 90 000 |
| (5) | 5 000 | 93 000 |

(......)

● **අංක 12 සහ 13 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිත කරන්න.**

කේවල ස්වාමි ව්‍යාපාරයක් වන මහින්ද ට්‍රේඩර්ස් ගිණුම් වාර්තා නිසි පරිදි පවත්වා නොගනී. මෙම ආයතනයේ 2022.03.31 දිනට සහ 2022.03.01 දිනට වත්කම් සහ වගකීම් කිහිපයක් පහත දී ඇත.

| | 2022.03.31 දිනට (රු.) | 2022.03.01 දිනට (රු.) |
|---|---|---|
| තොගය - පිරිවැයට | ? | 83 000 |
| වෙළෙඳ ණයගැතියෝ | 75 000 | 60 000 |
| වෙළෙඳ ණයහිමියෝ | 15 000 | 5 000 |

2022.03.31 දිනෙන් අවසන් මාසය තුළදී ආයතනය විසින් වෙළෙඳ ණයගැතියන්ගෙන් රු. 50 000 ක් එකතු කරගන්නා ලද අතර, රු. 25 000 ක් වෙළෙඳ ණයහිමියන්ට ගෙවන ලදී.

ආයතනය විසින් විකුණුම් මිල මත 25% ක ලාභ ආන්තිකයක් පවත්වා ගනිමින් භාණ්ඩ විකුණනු ලබයි. සියලු ගැනුම් සහ විකුණුම් ණය පදනම මත සිදු කෙරේ.

02030001480113123

[හතරවැනි පිටුව බලන්න.

**12.** 2022.03.31 දිනෙන් අවසන් මාසය සඳහා ගැනුම් සහ විකුණුම්:

| | ගැනුම් (රු.) | විකුණුම් (රු.) |
|---|---|---|
| (1) | 15 000 | 35 000 |
| (2) | 15 000 | 65 000 |
| (3) | 25 000 | 50 000 |
| (4) | 35 000 | 35 000 |
| (5) | 35 000 | 65 000 |

(……)

**13.** 2022.03.31 දිනට තොගයේ පිරිවැය කොපමණ ද?

(1) රු. 48 750 (2) රු. 66 000 (3) රු. 69 250 (4) රු. 70 000 (5) රු. 71 750 (……)

**14.** විශ්වවිද්‍යාල සිසුන්ට ශිෂ්‍යත්ව ලබාදීම සඳහා 2020.01.01 දින 'තිරසාර' සුබසාධක සංගමය පිහිටුවන ලදී. 2021.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මෙම සංගමයේ ලැබීම් සහ ගෙවීම් ගිණුමේ විස්තර පහත පරිදි වේ. (කෙසේ වුව ද, 2021 වර්ෂය සඳහා ශිෂ්‍යත්ව ගෙවීම් මේ තුළ ඇතුළත් වී නොමැත.)

| | රු.' 000 |
|---|---|
| 2021.01.01 දිනට ශේෂය | 1 500 |
| වර්ෂය තුළදී ලද පරිත්‍යාග | 2 000 |
| වර්ෂය සඳහා ලද පොලිය | 180 |
| සිසුන් 10 දෙනෙකුගේ, 2020 වර්ෂයේදී හිඟහිටි ශිෂ්‍යත්ව සඳහා ගෙවීම | 20 |

පරිත්‍යාග ඒවා ලද වසරේදීම ආදායම ලෙස හඳුනාගැනේ. සෑම සිසුවෙකු සඳහාම රු. 24 000 ක වාර්ෂික ශිෂ්‍යත්වයක් ලබාදෙන අතර, එය මාසිකව රු. 2 000 බැගින් ගෙවනු ලබයි. 2021 වර්ෂය සඳහා ශිෂ්‍යත්ව ලබාදීමට තෝරාගත් මුළු සිසුන් සංඛ්‍යාව 90 ක් වූ අතර, මෙයින් සිසුන් 75 දෙනෙකුට මුළු වර්ෂයම සඳහා ද ඉතිරි සිසුන් සඳහා මාස 10 කට පමණක් ද මුදල් ගෙවා ඇත. මෙම හිඟ මුදල 2022 වර්ෂය තුළදී ගෙවන ලදී.

2021.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සංගමයේ අතිරික්තය/(හිඟය) සහ 2021.12.31 දිනට ලැබීම් හා ගෙවීම් ගිණුමේ ශේෂය:

| | අතිරික්තය/(හිඟය) (රු.'000) | ලැබීම් හා ගෙවීම් ගිණුමේ ශේෂය (රු.'000) |
|---|---|---|
| (1) | (160) | 1 560 |
| (2) | (160) | 1 860 |
| (3) | 20 | 1 560 |
| (4) | 20 | 1 860 |
| (5) | 80 | 1 560 |

(……)

**15.** හවුල් ව්‍යාපාරයක මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් පහත කුමන ප්‍රකාශ **නිවැරදි** වේ ද?

A - හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන පොලී, වේතන සහ ලාභ කොටස් ලෙස හවුල් ව්‍යාපාරයක ලාභය විසර්ජනය කළ හැකි ය.

B - හවුල් ව්‍යාපාරයකට මුදල් ප්‍රවාහ ප්‍රකාශනයක් පිළියෙල කළ නොහැකි ය.

C - හවුල්කරුවන්ගේ භාණ්ඩ ගැනිලි හවුල් ව්‍යාපාරයේ ලාභය විසර්ජනය කිරීමේදී ගැළපිය යුතු ය.

D - ව්‍යාපාරයට හවුල්කරුවන් විසින් ලබාදුන් ණය මත පොලිය, හවුල් ව්‍යාපාරයේ වියදමක් ලෙස හඳුනාගනු ලබයි.

(1) A හා B පමණි. (2) A හා D පමණි. (3) B හා C පමණි.
(4) A, B හා D පමණි. (5) A, C හා D පමණි. (……)

**16.** හවුල් ව්‍යාපාරයක හවුල්කරුවන්ට හිමිවන ප්‍රතිලාභ සම්බන්ධයෙන් පහත කුමන ප්‍රකාශ **නිවැරදි** වේ ද?

A - හවුල්කරුවෙකු විශ්‍රාම යන අවස්ථාවේදී, හවුල් ව්‍යාපාරයේ සටහන් නොකරන ලද වත්කම්වලින් පැනනගින ප්‍රතිලාභය ඔහුගේ/ඇයගේ ලාභ අනුපාතයට අනුරූපීව හිමි වේ.

B - හවුල්කරුවෙකු විසින් ලබා දී ඇති ණයක් සඳහා පොලියක් ලබාදිය හැකි වන්නේ එය හවුල් ව්‍යාපාර ගිවිසුමේ සඳහන්ව ඇත්නම් පමණි.

C - හවුල් ව්‍යාපාර ගිවිසුමේ සඳහනක් නොමැති විට, හවුල් ආඥාපනතේ 24 වන වගන්තියට අනුව හවුල්කරුවන් වේතනයකට හිමිකම් නොලබයි.

D - හවුල් ව්‍යාපාර ගිවිසුමේ සඳහන්ව ඇත්නම්, ප්‍රාග්ධනය මත පොලියක් ලැබීමට හවුල්කරුවන්ට හිමිකම් ඇත.

(1) A හා B පමණි. (2) C හා D පමණි. (3) A, B හා C පමණි.
(4) A, C හා D පමණි. (5) A, B, C හා D යන සියල්ලම ය. (……)

[පස්වැනි පිටුව බලන්න.

**17.** 'LKAS 1 - මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම' ප්‍රමිතයට අනුව පහත කුමන ප්‍රකාශය/ප්‍රකාශ **නිවැරදි** වේ ද?

A - ආයතනයක් විසින් එහි සියලු මූල්‍ය ප්‍රකාශන උපචිත පදනමට පිළියෙල කළ යුතු ය.

B - වෙනත් ප්‍රමිතයකින් අවසර දී ඇති අවස්ථාවක හැර ආයතනයක් විසින් එහි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී වත්කම් සහ වගකීම් හිලව් නොකළ යුතු ය.

C - සම්පූර්ණ මූල්‍ය ප්‍රකාශන කට්ටලයක් තුළ ඇතුළත් සියලු මූල්‍ය ප්‍රකාශන, ආයතනයක් විසින් සමාන ප්‍රමුඛත්වයකින් ඉදිරිපත් කළ යුතු ය.

(1) A පමණි. (2) B පමණි. (3) C පමණි.
(4) A හා C පමණි. (5) B හා C පමණි. (......)

063123

**18.** ඇඟලුම් අපනයන සමාගමක් විසින් 2022 මාර්තු මාසය තුළදී නිෂ්පාදනය කරන ලද කමිස ඇණවුමක් සඳහා දරන ලද නිෂ්පාදන පිරිවැයට අදාළ තොරතුරු පහත දැක්වේ.

| විස්තරය | රු.' 000 |
|---|---|
| අමුද්‍රව්‍ය ගැනුම් | 1 680 |
| අමුද්‍රව්‍ය ගෙනඒමේ කුලිය | 600 |
| ගබඩාවෙහි ගින්නක් හේතුවෙන් විනාශ වූ අමුද්‍රව්‍ය පිරිවැය | 380 |
| සෘජු ශ්‍රමය | 1 200 |
| කමිස සඳහා වෙන්කළ නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය | 900 |

2022 මාර්තු මාසය තුළදී නිෂ්පාදනය කරන ලද මුළු කමිස ප්‍රමාණයම 2022.03.31 දිනට තොගය ලෙස පැවතුණි. මෙම කමිස ගබඩාකිරීම සඳහා දරන ලද පිරිවැය රු.250 000 ක් විය. 2022.03.01 දිනට හා 2022.03.31 දිනට අමුද්‍රව්‍ය හා නොනිමි තොග නොතිබූ බව උපකල්පනය කරන්න.

'LKAS 2 - තොග' ප්‍රමිතයට අනුව 2022.03.31 දිනට මෙම කමිස තොගයේ පිරිවැය:

(1) රු. 3 400 000 (2) රු. 4 000 000 (3) රු. 4 250 000
(4) රු. 4 380 000 (5) රු. 4 630 000 (......)

**19.** 'LKAS 7 - මුදල් ප්‍රවාහ ප්‍රකාශනය' ප්‍රමිතයට අනුව පහත කුමන අයිතමය/අයිතම නිෂ්පාදන ව්‍යාපාරයක ආයෝජන ක්‍රියාකාරකම් තුළින් ඇතිවන මුදල් ප්‍රවාහ ලෙස වර්ග කළ යුතු ද?

A - වෙනත් සමාගම්වල සාමාන්‍ය කොටස් මිල දී ගැනීම සඳහා ගෙවූ මුදල්

B - වසරක කල්පිරීමේ කාලයක් සහිත භාණ්ඩාගාර බිල්පත් මිල දී ගැනීම සඳහා ගෙවූ මුදල්

C - භාවිත අයිතිය සහිත වත්කමක් හා බැඳි කල්බදු වගකීම පියවීම සඳහා ගෙවූ මුදල්

(1) A පමණි. (2) B පමණි. (3) A හා B පමණි.
(4) A හා C පමණි. (5) A, B හා C යන සියල්ලම ය. (......)

**20.** 'LKAS 8 - ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තු වෙනස්වීම් සහ වැරදි' ප්‍රමිතයට අනුව පහත කුමන ප්‍රකාශය/ප්‍රකාශ **නිවැරදි** වේ ද?

A - යන්ත්‍රවල ක්ෂය ක්‍රමය සරල මාර්ග ක්‍රමයේ සිට හීනවන ශේෂ ක්‍රමයට වෙනස් කිරීම ගිණුම්කරණ ඇස්තමේන්තු වෙනස්වීමක් ලෙස සලකනු ලබයි.

B - තොග ආගණනය සඳහා යොදාගනු ලබන පිරිවැය සූත්‍රය පෙර-පිවිසි පෙර-පිට (FIFO) ක්‍රමයේ සිට භරිත සාමාන්‍ය පිරිවැය (WAC) ක්‍රමයට වෙනස් කිරීම ගිණුම්කරණ ප්‍රතිපත්ති වෙනස්වීමක් ලෙස සලකනු ලබයි.

C - ප්‍රායෝගිකව සිදුකළ නොහැකි අවස්ථාවල හැර, පෙර කාලච්ඡේද ප්‍රමාණාත්මක වැරදි, මූල්‍ය ප්‍රකාශනවල අතීතානුයෝගීව නිවැරදි කරනු ලබයි.

(1) B පමණි. (2) C පමණි. (3) A හා B පමණි.
(4) B හා C පමණි. (5) A, B හා C යන සියල්ලම ය. (......)

**21.** සීමිත උදය පොදු සමාගම වසර 5 ක කාලයකට මෝටර් රථයක භාවිත අයිතිය ලබා ගැනීම සඳහා 2022.03.31 දින කල්බදු ගිවිසුමකට එළඹෙන ලදී. මෙම දිනයේදී රු. 3 000 000 ක මූලික ගෙවීමක් සිදුකරන ලදී. කල්බදු ගිවිසුමට අනුව, රු. 1 055 190 ක් බැගින් වූ වාර්ෂික කල්බදු වාරික 5 ක් කල්බදු කාලසීමාව තුළ ගෙවිය යුතු අතර, පළමු වාරිකය 2023.03.31 දින ගෙවිය යුතු වේ. මෙම කල්බදු ගිවිසුමට අදාළ මුළු පොලිය රු. 1 275 950 ක් වේ. මෙම කල්බද්දෙහි වාර්ෂික ගම්‍ය පොලී අනුපාතය 10% ක් වේ.

'SLFRS 16 - කල්බදු' ප්‍රමිතයට අනුව 2022.03.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි ජංගම වගකීමක් ලෙස නිරූපණය කරනු ලබන කල්බදු වගකීම:

(1) රු. 355 190 (2) රු. 655 190 (3) රු. 827 985
(4) රු. 1 055 190 (5) රු. 2 944 810 (......)

01030001480113123

**22.** සීමිත සුරංග පොදු සමාගමේ 2022.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හඳුනාගත් මුළු ආදායම සහ මුළු වියදම පිළිවෙළින් රු. 5 000 000 ක් සහ රු. 3 500 000 ක් විය.

හඳුනාගත් මුළු ආදායම තුළ පහත ද ඇතුළත් ය.

- ඉඩම් ප්‍රථම වරට ප්‍රත්‍යාගණනය තුළින් ඇති වූ අතිරික්තය රු. 800 000
- යන්ත්‍රයක් විකිණීම තුළින් ඇති වූ ලාභය රු. 200 000

හඳුනාගත් මුළු වියදම තුළ මෝටර් රථ ප්‍රථම වරට ප්‍රත්‍යාගණනය තුළින් ඇති වූ රු. 300 000 ක ප්‍රත්‍යාගණන ඌනතාවයක් ද ඇතුළත් වේ.

2022.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභය සහ වෙනත් විස්තීරණ ආදායම:

| | ලාභය (රු.'000) | වෙනත් විස්තීරණ ආදායම (රු.'000) |
|---|---|---|
| (1) | 700 | 800 |
| (2) | 700 | 1 500 |
| (3) | 800 | 700 |
| (4) | 1 000 | 500 |
| (5) | 1 000 | 800 |

(......)

**23.** පහත තොරතුරු 2022.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සීමිත සමන් පොදු සමාගමට අදාළ වේ.

| | රු. |
|---|---|
| ප්‍රවර්තන වර්ෂය තුළදී ගෙවූ මුළු ආදායම් බදු තුළ පහත ද ඇතුළත් වේ: | |
| ● ප්‍රවර්තන වර්ෂයේ පළමු කාර්තු තුන සඳහා ස්ව-තක්සේරුව මත ගෙවූ ආදායම් බදු | 2 750 000 |
| ● පසුගිය වර්ෂය සඳහා ගෙවිය යුතු ආදායම් බදු ශේෂය ගෙවීම | 900 000 |
| ප්‍රවර්තන වර්ෂයේ අවසාන කාර්තුව සඳහා ආදායම් බදු වගකීම | 1 200 000 |
| 2021.03.31 දිනට ආදායම් බදු ප්‍රතිපාදනය | 800 000 |

2022.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හඳුනාගත් ආදායම් බදු වියදම:

(1) රු. 2 750 000 (2) රු. 3 650 000 (3) රු. 3 850 000
(4) රු. 3 950 000 (5) රු. 4 050 000 (......)

● **අංක 24 සහ 25 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිත කරන්න.**

පහත තොරතුරු සීමිත සවිනි පොදු සමාගමට අදාළ වේ.

| | රු.'000 |
|---|---|
| **2022.03.31 දිනට ප්‍රාග්ධන ව්‍යුහය:** | |
| – හිමිකම | 200 000 |
| – 10% බැංකු ණය | 150 000 |
| **2022.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා:** | |
| – විකුණුම් | 200 000 |
| – බදු පෙර ලාභය | 15 000 |
| – වර්ෂය සඳහා බදු | 3 000 |
| – සාමාන්‍ය තොගය | 20 000 |

විකුණුම් මිල මත 20% ක ලාභ ආන්තිකයක් තබා ගනිමින් සමාගම භාණ්ඩ විකුණනු ලබයි. 10% බැංකු ණය 2021.04.01 දින ලබාගත් අතර, එහි ශේෂය වර්ෂය තුළදී නොවෙනස්ව පැවතුණි.

**24.** පොලී ආවරණ අනුපාතය සහ ණය හිමිකම් අනුපාතය:

| | පොලී ආවරණ අනුපාතය (වාර) | ණය හිමිකම් අනුපාතය |
|---|---|---|
| (1) | 0.8 | 0.75 |
| (2) | 0.8 | 1.33 |
| (3) | 1.0 | 0.75 |
| (4) | 2.0 | 0.75 |
| (5) | 2.0 | 1.33 |

(......)

**25.** හිමිකම මත ප්‍රතිලාභ අනුපාතය සහ තොග පිරිවැටුම් අනුපාතය:

| | හිමිකම මත ප්‍රතිලාභ අනුපාතය (%) | තොග පිරිවැටුම් අනුපාතය (වාර) |
|---|---|---|
| (1) | 4.50 | 7.5 |
| (2) | 4.50 | 8.0 |
| (3) | 6.00 | 8.0 |
| (4) | 6.00 | 10.0 |
| (5) | 17.50 | 12.0 |

(......)

[හත්වැනි පිටුව බලන්න.

**26.** සමාගමක් විසින් ඉදිරි කාලච්ඡේදයේදී ඒකක 1 000 ක් නිෂ්පාදනය කිරීමට සැලසුම් කරමින් සිටී. මේ සම්බන්ධයෙන් පහත ඇස්තමේන්තු පිළියෙල කර ඇත.

| | රු. |
|---|---|
| මුළු අමුද්‍රව්‍ය පිරිවැය | 200 000 |
| මුළු සෘජු ශ්‍රම පිරිවැය | 140 000 |
| මුළු විචල්‍ය නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය | 60 000 |
| මුළු විචල්‍ය නිෂ්පාදන නොවන පොදුකාර්ය පිරිවැය | 300 000 |
| මුළු ස්ථාවර නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය | 200 000 |
| මුළු ස්ථාවර නිෂ්පාදන නොවන පොදුකාර්ය පිරිවැය | 600 000 |

**අතිරේක තොරතුරු:**

නිෂ්පාදන ඒකක මත පදනම්ව ස්ථාවර නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

ඒකකයක නිෂ්පාදන පිරිවැය කොපමණ ද?

(1) රු. 600 (2) රු. 900 (3) රු. 1 000 (4) රු. 1 200 (5) රු. 1 500 (……)

**27.** නිෂ්පාදන ව්‍යාපාරයක් විසින් භාවිත කරන අමුද්‍රව්‍ය වර්ගයක වාර්ෂික පරිභෝජනය ඒකක 3 000 ක් වේ. මෙම අමුද්‍රව්‍යයේ ඇණවුමක පිරිවැය රු. 300 ක් වන අතර, එහි ඒකකයක වාර්ෂික රඳවාගැනීමේ පිරිවැය රු. 5 ක් වේ. මෙම අමුද්‍රව්‍යයේ ආර්ථික ඇණවුම් ප්‍රමාණය (EOQ):

(1) ඒකක 100 (2) ඒකක 173 (3) ඒකක 424 (4) ඒකක 600 (5) ඒකක 1342 (……)

**28.** සමාගමක 2022 අප්‍රේල් මාසය සඳහා වැටුප් ලේඛනයෙන් පහත තොරතුරු උපුටා ගන්නා ලදී.

| | රු. |
|---|---|
| මූලික වැටුප | 880 000 |
| මාසික ජීවන වියදම් දීමනාව | 20 000 |
| ණය වාරික අඩු කිරීම | 150 000 |

**අතිරේක තොරතුරු:**

- සේවක අර්ථසාධක අරමුදල (EPF) සඳහා සේවක සහ සේව්‍ය දායකත්ව පිළිවෙළින් 8% ක් සහ 12% ක් වේ.
- සේවක භාරකාර අරමුදල (ETF) සඳහා දායකත්වය 3% ක් වේ.
- EPF සහ ETF සඳහා දායකත්වයන් මූලික වැටුප සහ සේවකයන්ට ගෙවනු ලබන දීමනා පදනම්ව ගණනය කරනු ලැබේ.

2022 අප්‍රේල් මාසයේ සමාගමේ මුළු වැටුප් වියදම (EPF සහ ETF වියදම් ද ඇතුළුව):

(1) රු. 813 000 (2) රු. 913 000 (3) රු. 1 035 000
(4) රු. 1 135 000 (5) රු. 1 150 000 (……)

**29.** පිරිවැය-පරිමා-ලාභ විශ්ලේෂණය සම්බන්ධව පහත කුමන ප්‍රකාශය **අසත්‍ය** වේ ද?

(1) සමච්ඡේදන ලක්ෂ්‍යයේදී, මුළු දායකය, මුළු ස්ථාවර පිරිවැයට සමාන වේ.
(2) සමච්ඡේදන ලක්ෂ්‍යයෙන් ඔබ්බට මුළු ලාභය, මුළු දායකයෙන් මුළු ස්ථාවර පිරිවැය අඩු කළ විට ලැබෙන අගයට සමාන වේ.
(3) මුළු ස්ථාවර පිරිවැය, දායක-විකුණුම් අනුපාතයෙන් බෙදීමෙන් සමච්ඡේදන ලක්ෂ්‍යයේ විකුණුම් වටිනාකම ගණනය කරනු ලැබේ.
(4) ලාභය, දායක-විකුණුම් අනුපාතයෙන් බෙදීමෙන් ආරක්ෂිත ආන්තිකයේ වටිනාකම ගණනය කළ හැකි ය.
(5) සමච්ඡේදන ලක්ෂ්‍යයේදී විකුණුම් අයභාරය මුළු ස්ථාවර පිරිවැයට සමාන වේ. (……)

**30.** ප්‍රාග්ධන ආයෝජන ව්‍යාපෘති ඇගයීම සම්බන්ධයෙන් පහත කුමන ප්‍රකාශය/ප්‍රකාශ **නිවැරදි** වේ ද?

A - ව්‍යාපෘතියක සාමාන්‍ය මුදල් ප්‍රවාහය එහි සාමාන්‍ය ආයෝජනයෙන් බෙදීමෙන් ගිණුම්කරණ ප්‍රතිලාභ අනුපාතය ගණනය කළ හැකි ය.

B - ව්‍යාපෘතියක් පිළිගෙවුම් කාලය මත ඇගයීමේදී පිළිගෙවුම් කාලයෙන් පසු ජනනය වන මුදල් ප්‍රවාහ සැලකිල්ලට නොගැනේ.

C - ව්‍යාපෘතියක ධන ශුද්ධ වර්තමාන අගය මගින් නිරූපණය වන්නේ එම ව්‍යාපෘතිය එහි අපේක්ෂිත ප්‍රතිලාභ අනුපාතයට වඩා වැඩි ප්‍රතිලාභයක් උපයන බව ය.

(1) A පමණි. (2) B පමණි. (3) C පමණි.
(4) A හා B පමණි. (5) B හා C පමණි. (……)

● **අංක 31 සිට 50 තෙක් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු තිත් ඉරි මත ලියන්න.**

**31.** ආයතනයක **කළමනාකරණ ගිණුම්කරණ තොරතුරුවලට** අදාළව පහත ප්‍රකාශ **සත්‍ය** ද (**T**) **අසත්‍ය** ද (**F**) යන්න සඳහන් කරන්න.

| **ප්‍රකාශය** | **සත්‍ය/අසත්‍ය** |
|---|---|
| A - තොරතුරු සැපයීමේදී ආයතනයේ අභ්‍යන්තර මාර්ගෝපදේශ අනුගමනය කරයි. | ................ |
| B - ආයතනයේ මූල්‍ය සහ මූල්‍ය නොවන තොරතුරු යන දෙවර්ගයම සපයයි. | ................ |
| C - ආයතනයේ කළමනාකරණ තීරණ ගැනීමට තොරතුරු සපයයි. | ................ |
| D - ආයතනයේ අනාගත තොරතුරු පමණක් සපයයි. | ................ |

**32.** 2022 මාර්තු මාසය තුළදී ආයතනයක් විසින් රු. 16 000 ක සුළු මුදල් වියදම් ගෙවා ඇති අතර, 2022.03.31 දිනට රු. 4 000 ක මුදලක් සුළු මුදල් භාරකරු සතු විය.

පහත දෑ සඳහන් කරන්න:

(අ) මෙම ආයතනයේ සුළු මුදල් අග්‍රිමය : රු. ................................

(ආ) සුළු මුදල් අග්‍රිමය ප්‍රතිපූරණය සටහන් කිරීම සඳහා ජර්නල් සටහන (*සංලක්ෂ්‍යය අවශ්‍ය නොවේ.*)

| **විස්තරය** | **හර (රු.)** | **බැර (රු.)** |
|---|---|---|
| ................................................................................ | .................. | |
| ................................................................................ | | .................. |

**33.** පරිගණක අලෙවි කිරීමේ නිරතවන තනි පුද්ගල ව්‍යාපාරයක් පහත ගනුදෙනු එහි ගිණුම්කරණ සමීකරණයේ හිමිකමෙහි ශේෂයට සිදුකරන බලපෑම **අගය ද සහිතව** සඳහන් කරන්න.

| **ගනුදෙනුව** | **හිමිකමෙහි ශේෂයට සිදුකරන බලපෑම: වැඩි වේ (I)/ අඩු වේ (D) / වෙනස් නොවේ (NC)** | **අගය (රු.)** |
|---|---|---|
| A - විකුණුම් මිල රු. 175 000 ක් වූ පරිගණකයක් පාසලකට පරිත්‍යාග කිරීම. එහි පිරිවැය රු. 150 000 ක් වේ. | .................. | .............. |
| B - අයිතිකරු විසින් භාවිත කරන ලද ඡායාපිටපත් යන්ත්‍රයක් ව්‍යාපාරයෙහි ආයෝජනය කරන ලදී. මෙම යන්ත්‍රයෙහි පිරිවැය රු. 750 000 ක් වූ අතර, ව්‍යාපාරයට ආයෝජනය කරන අවස්ථාවේදී එහි සාධාරණ අගය රු. 500 000 ක් විය. | .................. | .............. |

**34.** මධුර ට්‍රේඩර්ස් 2022.03.01 දින වෙළෙඳ ව්‍යාපාරයක් ආරම්භ කරන ලදී. ආයතනය විසින් ලැයිස්තුගත මිල මත 20% ක වෙළෙඳ වට්ටමකට යටත්ව සියලු විකුණුම් ණය පදනම මත සිදු කරනු ලබයි. විකුණූ දින සිට මාසයක ණය කාලයක් ණයගැතියන්ට ලබා දේ. විකුණූ දින සිට දින 15 ක් ඇතුළත පියවන ලද වටිනාකම් සඳහා ණයගැතියන්ට 10% ක මුදල් වට්ටමක් ලබා දෙනු ලැබේ.

විකුණුම් සහ ණයගැතියන් විසින් පියවූ වටිනාකම් පිළිබඳ විස්තර පහත දී ඇත.

| **විකුණුම් දිනය** | **විකුණූ භාණ්ඩවල ලැයිස්තුගත මිල (රු.'000)** | **2022 මාර්තු මාසය තුළදී ණයගැතියන් විසින් පියවන ලද ප්‍රතිශතය (%)** |
|---|---|---|
| 2022.03.10 | 5 000 | 60% (මෙයින් ½ ක්, දින 15 ක් තුළ පියවන ලදී.) |
| 2022.03.22 | 1 875 | 40% (මෙය දින 15 ක් තුළ පියවන ලදී.) |
| | **6 875** | |

පහත දෑ සඳහන් කරන්න :

(අ) 2022.03.31 දිනට ණයගැති පාලන ගිණුමේ ශේෂය: රු.'000 ................................

(ආ) 2022 මාර්තු මාසය සඳහා හඳුනාගත් දුන් වට්ටම: රු.'000 ................................

**35.** පහත එක් එක් පොදු ලෙජර ගිණුම්වලට අදාළවන මූල්‍ය ප්‍රකාශන මූලිකාංගය සඳහන් කරන්න.

| ගිණුම | මූල්‍ය ප්‍රකාශන මූලිකාංගය |
|---|---|
| A - ණයහිමි පාලන | ........................................ |
| B - සමුච්චිත ක්ෂය | ........................................ |
| C - ගැනිලි | ........................................ |
| D - ලද වට්ටම් | ........................................ |

**36.** ඇඟලුම් නිෂ්පාදන සමාගමක පහත එක් එක් අවස්ථාවට **වඩාත්** උචිත වන ගිණුම්කරණ සංකල්පය සඳහන් කරන්න.

| අවස්ථාව | ගිණුම්කරණ සංකල්පය |
|---|---|
| A - පිරිවැය සහ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගයට වසර අග තොගය ආගණනය කිරීම | ........................ |
| B - රෙදි තොගය ජංගම වත්කම් ලෙස සහ මහන මැෂින් ජංගම නොවන වත්කම් ලෙස වර්ගීකරණය කිරීම | ........................ |
| C - මහන මැෂින් සඳහා ක්ෂය, නිෂ්පාදන පිරිවැය තුළ හඳුනාගැනීම | ........................ |
| D - ගනුදෙනුකරුවන් සමග ඇති කරගත් ගිවිසුම්වල අඩංගු කාර්යසාධන බැඳීම් ඉටු කිරීම මත පදනම්ව විකුණුම් අයභාරය හඳුනාගැනීම | ........................ |

**37.** මූල්‍ය වාර්තාකරණයේ සංකල්පනාත්මක රාමුවට (2018) අනුව පහත වගන්ති සම්පූර්ණ කරන්න.

A - අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස ආර්ථික සම්පත් පවරා දීමට ආයතනයකට ඇති වර්තමාන බැඳීම .................................. ලෙස නිර්වචනය කෙරේ.

B - පොදු පරමාර්ථ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම අවශ්‍ය වන ආයතනයක්, .................................. .................................. ලෙස නිර්වචනය කෙරේ.

C - හඳුනාගැනීමේ නිර්ණායක හා සම්බන්ධ වන ගිණුම්කරණ තොරතුරුවල ගුණාත්මක ගතිලක්ෂණ දෙක වන්නේ, .......................................... සහ .......................................... ය.

● **අංක 38 සහ 39 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිත කරන්න.**

රංග සහ එරංග ලාභාලාභ පිළිවෙළින් 3: 2 අනුපාතයට බෙදාගනිමින් හවුල් ව්‍යාපාරයක් පවත්වාගෙන යන ලදී. 2022.03.31 දිනට රංග සහ එරංගගේ ප්‍රාග්ධන ශේෂ පිළිවෙළින් රු. 3 000 000 ක් සහ රු. 2 000 000 ක් විය. 2022.04.01 දින සුරංග, නව හවුල්කරුවෙකු ලෙස බඳවා ගන්නා ලදී. සුරංග රු. 1 500 000 ක මුදලක් ප්‍රාග්ධනය ලෙස ද රු. 500 000 ක මුදලක් ඔහුගේ කීර්තිනාම කොටස ලෙස ද ගෙන එන ලදී. හවුල් ව්‍යාපාරයේ කීර්තිනාමය හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් තුළින් ගළපනු ලැබේ. 2022.04.01 දින සිට රංග, එරංග සහ සුරංග ලාභාලාභ පිළිවෙළින් 5:3:2 අනුපාතයට බෙදා ගැනීමට එකඟ විය. 2022.04.01 දින රංග විසින් අතිරේක ප්‍රාග්ධනය ලෙස රු. 600 000 ක් ද ගෙන එන ලදී.

**38.** පහත දෑ සඳහන් කරන්න:

(අ) 2022.04.01 දිනට හවුල් ව්‍යාපාරයේ කීර්තිනාමය : රු. ..............................

(ආ) කීර්තිනාමය සටහන් කිරීමට සඳහා ජර්නල් සටහන (*සංලක්ෂ්‍යය අවශ්‍ය නොවේ.*):

| විස්තරය | හර (රු.) | බැර (රු.) |
|---|---|---|
| | | |

**39.** ඉහත සියලු ගනුදෙනු ගැළපීමෙන් පසු 2022.04.01 දිනට හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් ශේෂ:

(අ) රංග : රු.'000 ..............................

(ආ) එරංග : රු.'000 ..............................

(ඉ) සුරංග : රු.'000 ..............................

**40.** ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව ආයතනයක මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන විට පහත එක් එක් ප්‍රකාශය **සත්‍ය** ද (T) **අසත්‍ය** ද (F) යන්න සඳහන් කරන්න.

| | ප්‍රකාශය | සත්‍ය/අසත්‍ය |
|---|---|---|
| A - | දේපළ, පිරියත සහ උපකරණ අයිතමයක සුන්බුන් අගය වෙනස් වීම, ගිණුම්කරණ ඇස්තමේන්තු වෙනස්වීමක් ලෙස සලකනු ලබයි. | .................. |
| B - | වාර්තාකරණ කාලච්ඡේදයෙන් පසුව, එහෙත් මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා අනුමැතිය ලබා දීමට පෙර ප්‍රකාශයට පත්කරනු ලබන ලාභාංශ, වර්තාකරණ කාලච්ඡේදය අවසානයේදී වගකීමක් ලෙස හඳුනාගැනේ. | .................. |
| C - | තොගවල පිරිවැය මැනීම සඳහා නිශ්චිතවම හඳුනාගැනීමේ ක්‍රමය සුදුසු නොවන විට, එහි පිරිවැය පෙර-පිවිසි පෙර-පිට (FIFO) හෝ භරිත සාමාන්‍ය පිරිවැය (WAC) සූත්‍රය මත ඇස්තමේන්තු කළ යුතු ය. | .................. |
| D - | කාලය හෝ වටිනාකම අවිනිශ්චිත වර්තමාන බැඳීම්, විශ්වාසනීය ලෙස ඇස්තමේන්තු කළ නොහැකි වුවත් මූල්‍ය ප්‍රකාශන තුළ ප්‍රතිපාදනයන් ලෙස හඳුනාගැනේ. | .................. |

**41.** 2022.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සීමිත දමිත පොදු සමාගමේ මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා 2022.05.15 දින අධ්‍යක්ෂවරුන් විසින් අනුමත කරන ලදී.

'LKAS 10 - වාර්තාකරණ කාලච්ඡේදයට පසු සිදුවීම්' ප්‍රමිතයට අනුව 2022.04.01 දින සිට 2022.05.15 දින දක්වා කාලය තුළ සිදු වූ එක් එක් සිදුවීම **ගළපන** සිද්ධියක් ද **නොගළපන** සිද්ධියක් ද යන්න සඳහන් කරන්න.

| | සිද්ධිය | ගළපන/නොගළපන |
|---|---|---|
| A - | 2022.01.01 දින සමාගමට එරෙහිව ගොනු කරන ලද නඩුවක් සමථයට පත් කිරීම සඳහා රු. 1 500 000 ක් ගෙවීමට උසාවි නියෝගය ලැබුණි. කෙසේ වුව ද 2022.03.31 දිනට මේ සඳහා ප්‍රතිපාදනයක් සිදුකර නොතිබුණි. | .................. |
| B - | 2022.03.31 දිනට තොගය රු. 2 000 000 කින් අධි ගණනය කර තිබූ බව අනාවරණය වීම. | .................. |
| C - | කර්මාන්තශාලාවේ ඇති වූ ගින්නකින් 2022.03.31 දිනට ධාරණ වටිනාකම රු. 8 000 000 ක් වූ යන්ත්‍රයක් විනාශ වීම. | .................. |
| D - | රු. 10 000 000 ක් වූ සංචිත ප්‍රාග්ධනිත කිරීම. | .................. |

**42.** තක්සේරු වටිනාකම රුපියල් මිලියන 110 ක් වූ ගොඩනැගිල්ලක් රුපියල් මිලියන 100 කට 2021.04.01 දින සමාගමක් විසින් මිල දී ගන්නා ලදී. මෙදිනට මෙම ගොඩනැගිල්ලෙහි ඵලදායී ජීවකාලය සහ සුන්බුන් අගය පිළිවෙළින් වසර 50 ක් සහ ශූන්‍ය ලෙස ඇස්තමේන්තු කරන ලදී. මෙම ගොඩනැගිල්ල මිල දී ගත් දින සිට භාවිතය සඳහා සුදුසු වුව ද සමාගම විසින් 2021.07.01 දින සිට එය භාවිතයට ගැනීම ආරම්භ කරන ලදී. 2022.03.31 දිනට මෙම ගොඩනැගිල්ලෙහි සාධාරණ අගය රුපියල් මිලියන 120 ක් විය.

'LKAS 16 - දේපළ, පිරියත සහ උපකරණ' ප්‍රමිතයට අනුව මෙම ගොඩනැගිල්ල සඳහා පහත දැ සඳහන් කරන්න.

(අ) හඳුනාගන්නා අවස්ථාවේදී ගොඩනැගිල්ලෙහි මිනුම් කරන වටිනාකම: රු.මිලියන ..............................

(ආ) මෙම ගොඩනැගිල්ල ක්ෂය කිරීම ආරම්භ කළ යුතු දිනය: ..............................

(ඉ) පහත එක් එක් ආකෘතිය භාවිත කරන්නේ නම්, 2022.03.31 දිනට ගොඩනැගිල්ලේ ධාරණ වටිනාකම:

(i) පිරිවැය ආකෘතිය: රු.මිලියන ..............................

(ii) ප්‍රත්‍යාගණන ආකෘතිය: රු.මිලියන ..............................

**43.** සීමිත ඉඳුනිල් පොදු සමාගම විදුලි උපකරණ නිෂ්පාදනය කර විකුණනු ලබයි. 'LKAS 37 - ප්‍රතිපාදන, අසම්භාව්‍ය වගකීම් සහ අසම්භාව්‍ය වත්කම්' ප්‍රමිතයට අනුව මෙම සමාගමේ පහත එක් එක් අවස්ථාවේදී 2022.03.31 දිනට ප්‍රතිපාදනයක් හෝ අසම්භාව්‍ය වගකීමක් ඇතිවන්නේ ද යන්න **හේතුව ද සහිතව** සඳහන් කරන්න.

A - ගනුදෙනුකරුවන් ආපසු එවන ලද දෝෂ සහිත භාණ්ඩ සඳහා මුදල් ආපසු ගෙවීමේ අතීත පරිචයක් සහ ප්‍රසිද්ධ කරන ලද ප්‍රතිපත්තියක් සමාගම සතු වේ. කෙසේ වුව ද මේ සඳහා නෛතික ගිවිසුමක් නොමැත.

B - පේටන්ට් අයිතියක් උල්ලංඝනය කිරීම හේතුවෙන් තරගකාරී ආයතනයක් සමග සමාගමට වර්තමානයේදී ආරවුලක් පැනනැගී ඇත. සීමිත ඉඳුනිල් පොදු සමාගමට විරුද්ධව නඩුවක් පවරනු ලදහොත් සැලකිය යුතු වන්දි මුදලක් ගෙවීමට සිදුවනු ඇතැයි අපේක්ෂා කෙරේ.

| **අවස්ථාව** | **ප්‍රතිපාදනය/අසම්භාව්‍ය වගකීම** | **හේතුව** |
|---|---|---|
| A | .................................. | .............................................................. |
| B | .................................. | .............................................................. |

**44.** සීමිත අමාලි පොදු සමාගම විදුලි ජනන යන්ත්‍ර බද්දට දෙනු ලබන සමාගමකි. විදුලි ජනන යන්ත්‍රයක දෛනික බද්ද රු. 20 000 කි. සමාගම විසින් විදුලි ජනන යන්ත්‍රයක් දින 7 ක කාලයක් සඳහා සීමිත සමන් පොදු සමාගමට බදු දීමට 2022.03.29 දින ගිවිසුමකට එළඹෙන ලදී. එදින රු. 100 000 ක මුදලක් අත්තිකාරමක් ලෙස සමාගමට ලැබුණි. මෙම අත්තිකාරම තුළ ආපසු ගෙවිය යුතු රු. 50 000 ක තැන්පතුවක් ද ඇතුළත් වේ. 2022.03.30 දින උදෑසනම මෙම විදුලි ජනන යන්ත්‍රය සීමිත සමන් පොදු සමාගමේ ව්‍යාපාර පරිශ්‍රයට භාරදෙන ලදී.

'SLFRS 15 - ගනුදෙනුකරුවන් සමග ගිවිසුම්වලින් අයභාරය' ප්‍රමිතයට අනුව, පහත දෑ හඳුනාගන්න:

(අ) 2022.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හඳුනාගත් කුලී ආදායම: රු. ..................................

(ආ) 2022.03.31 දිනට හඳුනාගත් නොඉපයූ කුලී ආදායම: රු. ..................................

**45.** වෙළෙඳ සමාගමක 2022.03.31 දිනට ශේෂ පිරික්සුමෙන් උපුටා ගන්නා ලද තොරතුරු පහත දැක්වේ.

| | **රු.' 000** |
|---|---|
| ණයගැතියෝ | 4 500 |
| කලින් ගෙවූ වියදම් | 500 |
| මුදල් සහ මුදල් සමාන දෑ | 1 500 |
| ජංගම වගකීම් | 4 000 |
| විකුණුම් | 20 000 |

**අතිරේක තොරතුරු:**

- 2022.03.31 දිනට තොගය රු. 2 500 000 ක් විය.
- 2021.04.01 දිනට ණයගැතියෝ රු. 3 500 000 ක් විය.
- සියලු විකුණුම් ණය පදනම මත සිදු කෙරේ.

පහත දෑ හඳුනාගන්න:

(අ) ක්ෂණික වත්කම් අනුපාතය: ..................................

(ආ) ණය එකතු කිරීමේ කාලය: දින ..................................

**46.** නිෂ්පාදන ආයතනයක ද්‍රව්‍ය පාලන පද්ධතියක පහත එක් එක් ක්‍රියාකාරකමේදී යොදාගනු ලබන මූලාශ්‍ර ලේඛනය සඳහන් කරන්න.

| | **ක්‍රියාකාරකම** | **මූලාශ්‍ර ලේඛනය** |
|---|---|---|
| A - | නිෂ්පාදන අංශය විසින් ගබඩාවෙන් අමුද්‍රව්‍ය ඉල්ලුම් කිරීම. | .......................... |
| B - | ගබඩාව විසින් අමුද්‍රව්‍ය මිල දී ගැනීම සඳහා ගැනුම් දෙපාර්තමේන්තුවෙන් ඉල්ලුම් කිරීම. | .......................... |
| C - | ගැනුම් දෙපාර්තමේන්තුව විසින් සැපයුම්කරුවකුගෙන් අමුද්‍රව්‍ය මිල දී ගැනීම සඳහා ඇණවුමක් කිරීම. | .......................... |
| D - | සැපයුම්කරුවෙකුගෙන් ගබඩාවට අමුද්‍රව්‍ය ලැබීම. | .......................... |

**47.** පලතුරු යුෂ අලෙවි කරන ආයතනයක පහත එක් එක් පිරිවැය අයිතම සඳහා සුදුසු වර්ගීකරණය (සෘජු/වක්‍ර සහ විචල්‍ය/ස්ථාවර) හඳුනාගන්න.

| | **පිරිවැය අයිතමය** | **සෘජු/වක්‍ර** | **විචල්‍ය/ස්ථාවර** |
|---|---|---|---|
| A - | පලතුරුවල පිරිවැය | .............................. | .............................. |
| B - | පුවත්පතක ප්‍රචාරණය කිරීමේ පිරිවැය | .............................. | .............................. |
| C - | පලතුරු යුෂ සකස් කරන්නාගේ මාසික වැටුප | .............................. | .............................. |
| D - | නගර සභාවට ගෙවූ වාර්ෂික බලපත්‍ර ගාස්තුව | .............................. | .............................. |

**48.** පහත තොරතුරු භාණ්ඩයක් නිෂ්පාදනය කිරීම සඳහා යොදාගනු ලබන අමුද්‍රව්‍යයකට අදාළ වේ.

- උපරිම පරිභෝජනය (දිනකට) කිලෝ ග්‍රෑම් 600
- සාමාන්‍ය පරිභෝජනය (දිනකට) කිලෝ ග්‍රෑම් 400
- යළි ඇණවුම් ප්‍රමාණය කිලෝ ග්‍රෑම් 16 000
- සාමාන්‍ය පොරොත්තු කාලය දින 40
- උපරිම පොරොත්තු කාලය දින 60

පහත දෑ සඳහන් කරන්න:

(අ) යළි ඇණවුම් මට්ටම: ............................ (ආ) අවම තොග මට්ටම: ............................

(ඉ) උපරිම තොග මට්ටම: ............................

**49.** පෞද්ගලික සමාගමක් භාණ්ඩයක් නිෂ්පාදනය කර ඒකකයක් රු. 500 ක් බැගින් වූ මිලකට විකුණනු ලබයි. සමාගමේ උපරිම නිෂ්පාදන ධාරිතාව ඒකක 1 250 ක් වන අතර, ඉදිරි කාලච්ඡේදයේදී සමාගම 80% ක ධාරිතාවයකින් ක්‍රියාකිරීමට අපේක්ෂා කරයි. ධාරිතා මට්ටම 80% දී අයවැයගත තොරතුරු පහත පරිදි වේ.

| | | රු. |
|---|---|---|
| සෘජු ද්‍රව්‍ය (ඒකකයක් සඳහා) | | 100 |
| සෘජු ශ්‍රමය (ඒකකයක් සඳහා) | | 50 |
| මුළු නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය: | | |
| | විචල්‍ය | 50 000 |
| | ස්ථාවර | 120 000 |

සියලු සෘජු පිරිවැය, විචල්‍ය පිරිවැය ලෙස උපකල්පනය කරන්න.

පහත දෑ සඳහන් කරන්න:

(අ) සමච්ඡේදන ලක්ෂ්‍යය ඒකකවලින්: ඒකක ........................................

(ආ) ආරක්ෂිත ආන්තිකය ඒකකවලින්: ඒකක ........................................

(ඉ) විකුණුම් මිල 10% කින් අඩුවන්නේ නම්, සමච්ඡේදන ලක්ෂ්‍යය රුපියල්වලින් : රු. ..............................

**50.** සමාගමක් විසින් වත්කමක් මිල දී ගැනීම සම්බන්ධයෙන් වන දිගුකාලීන ව්‍යාපෘතියක් සලකා බලමින් සිටී. පහත තොරතුරු ව්‍යාපෘති ඇගයීම් වාර්තාවෙන් උපුටා ගන්නා ලදී.

- ව්‍යාපෘතියේ ජීවකාලය වසර 5
- ව්‍යාපෘතියේ පිළිගෙවුම් කාලය වසර 3.5
- ව්‍යාපෘතියේ වාර්ෂික මෙහෙයුම් ශුද්ධ මුදල් ගලාඒම් රු. 400 000
- ව්‍යාපෘතිය අවසානයේ වත්කමෙහි සුන්බුන් අගය රු. 250 000
- ව්‍යාපෘතියේ අපේක්ෂිත ශුද්ධ මුදල් ගලාඒම්වල වර්තමාන අගය රු. 1 672 000

මෙම ව්‍යාපෘතියේ අතිරේක කාරක ප්‍රාග්ධන අවශ්‍යතාවයක් නොමැති බව උපකල්පනය කරන්න.

ව්‍යාපෘතිය සඳහා පහත දෑ සඳහන් කරන්න:

(අ) ආරම්භක ආයෝජනය: රු. ..............................

(ආ) 5 වන වසරෙහි මුළු ශුද්ධ මුදල් ගලාඒම්: රු. ..............................

(ඉ) ශුද්ධ වර්තමාන අගය (NPV): රු. ..............................

PAST PAPERS WIKI
WWW.PastPapers.WIKI

* * *

Download past papers, notes, and more from Past Papers Wiki!

63123

AL/2022(2023)/33/S-II

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**
**இலங்கைப் பரீட்சைத் திணைக்களம்**
**Department of Examinations, Sri Lanka**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2022(2023)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2022(2023)
General Certificate of Education (Adv. Level) Examination, 2022(2023)

**ගිණුම්කරණය II**
கணக்கீடு II
Accounting II

**33 S II**

*පැය තුනයි*
*மூன்று மணித்தியாலம்*
*Three hours*

**අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි**
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කරගැනීමටත් යොදාගන්න.**

**වැඩසටහන් සම්පාදනය කළ නොහැකි ගණක යන්ත්‍ර භාවිතයට අවසර දෙනු ලැබේ.**

**උපදෙස්:**
※ **පළමුවන** හා **දෙවන** ප්‍රශ්න ඇතුළුව ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.
※ සෑම ප්‍රශ්නයකට ම පිළිතුරු ලිවීම **අලුත් කඩදාසියකින්** ආරම්භ කරන්න.
※ අදාළ පෙරවැඩ, පිළිතුරු පත්‍රය සමඟ අමුණන්න.
※ මෙම ප්‍රශ්න පත්‍රයට ලකුණු **200** ක් හිමි වේ.

**1.** සීමිත දමිත පොදු සමාගමේ 2022.03.31 දිනට සාරාංශගත ශේෂ පිරික්සුම පහත දී ඇත.

| **විස්තරය** | **හර (රු.'000)** | **බැර (රු.'000)** |
|---|---|---|
| දේපළ, පිරියත සහ උපකරණ | 80 000 | |
| 2021.04.01 දිනට සමුච්චිත ක්ෂය - දේපළ, පිරියත සහ උපකරණ | | 11 000 |
| විකුණුම් | | 72 200 |
| විකුණුම් පිරිවැය | 43 000 | |
| තොගය | 3 250 | |
| වෙනත් ආදායම් | | 1 800 |
| වෙළෙඳ ලැබිය යුතු දෑ | 9 100 | |
| වෙළෙඳ ගෙවිය යුතු දෑ | | 5 250 |
| මුදල් සහ මුදල් සමාන දෑ | 500 | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය - සාමාන්‍ය කොටස් | | 40 000 |
| 2021.04.01 දිනට රඳවාගත් ඉපැයුම් | | 17 700 |
| ප්‍රත්‍යාගණන සංචිතය - ගොඩනැගිලි | | 5 000 |
| පරිපාලන වියදම් | 8 800 | |
| බෙදාහැරීමේ පිරිවැය | 6 200 | |
| මූල්‍ය පිරිවැය | 1 500 | |
| වෙනත් වියදම් | 600 | |
| ගෙවූ ආදායම් බදු | 900 | |
| 2021.04.01 දිනට ආදායම් බදු සඳහා ප්‍රතිපාදන | | 400 |
| වන්දි සඳහා ප්‍රතිපාදන | | 500 |
| | **153 850** | **153 850** |

[ දෙවැනි පිටුව බලන්න.

**අතිරේක තොරතුරු:**

2022.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට පෙර පහත දෑ සඳහා ගැළපීම් කළ යුතු වේ.

(i) 2022.03.31 දිනට තොගය, අයිතම තුනකින් සමන්විත වූ අතර, ඒවායේ පිරිවැය සහ ශුද්ධ උපලබ්ධි අගය පහත පරිදි විය.

| අයිතමය | පිරිවැය (රු.'000) | ශුද්ධ උපලබ්ධි අගය (රු.'000) |
|---|---|---|
| A | 1 250 | 1 600 |
| B | 1 200 | 1 100 |
| C | 900 | 550 |
| | **3 350** | **3 250** |

පිරිවැය සහ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගයට තොග මිනුම් කිරීමේදී අයිතම ක්‍රමය පදනම් කර ගැනීම සමාගමේ ප්‍රතිපත්තිය වේ. කෙසේ වුව ද, මෙම ප්‍රතිපත්තියට පටහැනිව 2022.03.31 දිනට තොගය මිනුම් කර ඇත්තේ මෙම අයිතම තුනෙහිම මුළු පිරිවැය සහ මුළු ශුද්ධ උපලබ්ධි අගය සංසන්දනය කිරීමෙනි. ඒ අනුව තොගයේ පිරිවැය රු. 100 000 කින් කපා හරින ලද අතර, එය වෙනත් වියදම් තුළ ඇතුළත් කර ඇත.

(ii) ශේෂ පිරික්සුම තුළ දක්වා ඇති වන්දි සඳහා ප්‍රතිපාදනය, සමාගමට එරෙහිව ගනුදෙනුකරුවෙකු විසින් ගොනු කරන ලද නඩුවක් සම්බන්ධයෙන් සිදුකර ඇත. 2022.05.01 දින උසාවිය විසින් තීන්දුව ලබාදුන් අතර, ඒ අනුව සමාගම විසින් රු. 700 000 ක වන්දියක් ගෙවන ලදී. 2022.06.01 දින සමාගමේ අධ්‍යක්ෂවරුන් විසින් මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා අනුමැතිය ලබාදෙන ලදී.

(iii) දේපළ, පිරියත සහ උපකරණවල සංයුතිය සහ ඒවායේ සමුච්චිත ක්ෂය පහත පරිදි වේ.

| විස්තරය | 2022.03.31 දිනට පිරිවැය/අගය (රු.'000) | 2021.04.01 දිනට සමුච්චිත ක්ෂය (රු.'000) |
|---|---|---|
| ඉඩම් | 30 000 | — |
| ගොඩනැගිලි | 25 000 | 2 000 |
| මෝටර් රථ | 15 000 | 5 000 |
| කාර්යාල උපකරණ | 10 000 | 4 000 |
| | **80 000** | **11 000** |

සියලුම දේපළ, පිරියත සහ උපකරණ පරිපාලන කටයුතු සඳහා භාවිත කෙරේ. 2022.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ක්ෂය වෙන් කළ යුතු වේ. මෙම වත්කම්වල සුන්බුන් අගයක් නොමැත. (ක්ෂය ගණනය කිරීමේදී අතිරේක තොරතුරු (iv), (v) සහ (vi) ද සැලකිල්ලට ගත යුතු වේ.)

(iv) 2019.03.31 දින ගොඩනැගිලි සහ මෝටර් රථ **ප්‍රථම වරට** ප්‍රත්‍යාගණනය කරන ලද අතර, එය පොත්වල නිවැරදිව සටහන් කර ඇත. මේ සම්බන්ධ විස්තර පහත දී ඇත.

| | ගොඩනැගිලි | මෝටර් රථ |
|---|---|---|
| ප්‍රත්‍යාගණන අතිරික්තය (රු.'000) | 5 000 | — |
| ප්‍රත්‍යාගණන ඌනතාවය (රු.'000) | — | 1 000 |
| ප්‍රථම වරට ප්‍රත්‍යාගණනය කළ දින සිට ඉතිරි ඵලදායී ජීවකාලය (වසර) | 25 | 6 |

2022.03.31 දින ගොඩනැගිලි සහ මෝටර් රථ **දෙවන වරට** පහත පරිදි ප්‍රත්‍යාගණනය කරන ලදී.

| | ගොඩනැගිලි | මෝටර් රථ |
|---|---|---|
| ප්‍රත්‍යාගණන අගය (රු.'000) | 20 000 | 7 000 |

කෙසේ වුව ද, ගොඩනැගිලි සහ මෝටර් රථ දෙවන වරට ප්‍රත්‍යාගණනය කිරීම සම්බන්ධයෙන් කිසිදු ගිණුම්කරණ සටහනක් තබා නොමැත. 2019.03.31 දිනෙන් පසු ගොඩනැගිලි සහ මෝටර් රථ මිල දී ගැනීම් හෝ ඉවත් කිරීම් සිදු වී නොමැත.

(v) 2021.10.01 දින කාර්යාල පරිගණක කිහිපයක් රු. 1 600 000 කට විකුණන ලද අතර, මෙම පරිගණක 2020.10.01 දින රු. 2 000 000 කට මිල දී ගෙන ඇත. සමාගම විසින් කාර්යාල උපකරණ සරල මාර්ග ක්‍රමයට පිරිවැය මත වාර්ෂිකව 20% බැගින් ක්ෂය කරනු ලැබේ. මෙම පරිගණක විකිණීමෙන් ලද මුදල්, මුදල් ගිණුමට හර කර, වෙනත් ආදායම් ගිණුමට බැර කර ඇත. මෙම විකිණීම සම්බන්ධයෙන් වෙනත් කිසිදු ගිණුම්කරණ සටහනක් තබා නොමැත.

[තුන්වැනි පිටුව බලන්න.

(vi) ප්‍රවර්තන වර්ෂය තුළදී පහත දේපළ, පිරියත සහ උපකරණ අයිතම මිල දී ගන්නා ලද අතර, ඒවා නිසි පරිදි ගිණුම්ගත කර ඇත.

| මිල දී ගත් දිනය | අයිතමය | පිරිවැය (රු.'000) |
|---|---|---|
| 2021.07.01 | ඉඩම | 8 000 |
| 2021.10.01 | ඡායාපිටපත් යන්ත්‍රය | 1 500 |

(vii) අධ්‍යක්ෂවරුන්ගේ ගාස්තු රු. 1 900 000 ක් සහ සාමාන්‍ය කොටස්කරුවන්ට ගෙවූ රු. 1 100 000 ක අතුරු ලාභාංශ පරිපාලන වියදම් තුළ ඇතුළත් කර ඇත.

(viii) 2021.04.01 දින සමාගම විසින් කල්බදු ගිවිසුමක් යටතේ ගොඩනැගිල්ලක භාවිත අයිතිය ලබා ගන්නා ලදී. මෙම කල්බද්දෙහි විස්තර පහත පරිදි වේ.

| | |
|---|---|
| කල්බදු කාලය | වසර 5 යි |
| ගොඩනැගිල්ලේ ඵලදායී ජීවකාලය | වසර 25 යි |
| භාවිත අයිතිය සහිත වත්කමේ මූලික පිරිවැය (රු.'000) | 2 750 |
| කල්බදු වගකීමේ මූලික වටිනාකම (රු.'000) | 2 750 |
| වාර්ෂික කල්බදු වාරිකය (රු.'000) | 820 |
| 2022.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා කල්බදු පොලිය (රු.'000) | 412 |
| 2023.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා කල්බදු පොලිය (රු.'000) | 350 |

කල්බදු කාලසීමාව අවසානයේදී භාවිත අයිතිය සහිත වත්කමේ අයිතිය සමාගමට මාරු නොවේ. කල්බදු වාරිකය සෑම වර්ෂයකම මාර්තු 31 දින ගෙවිය යුතු වේ. ඒ අනුව, ප්‍රථම වාර්ෂික කල්බදු වාරිකය 2022.03.31 දින ගෙවන ලද අතර, එය වැරදීමකින් බෙදාහැරීමේ පිරිවැය තුළ ඇතුළත් කර ඇත. මෙම කල්බද්ද සම්බන්ධයෙන් වෙනත් කිසිදු ගිණුම්කරණ සටහනක් තබා නොමැත. භාවිත අයිතිය සහිත වත්කම් සමාගමේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි මුහුණතේ වෙනම අයිතමයක් ලෙස ඉදිරිපත් කරනු ලබයි.

(ix) ශේෂ පිරික්සුමේ දක්වා ඇති ගෙවූ ආදායම් බදු සමන්විත වන්නේ පසුගිය වසර සඳහා ගෙවූ රු. 320 000 ක් සහ ප්‍රවර්තන වර්ෂයේ ප්‍රථම කාර්තු තුන සඳහා ගෙවන ලද බදු වලිනි. 2022.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුළු ආදායම් බදු වගකීම රු. 1 200 000 ක් ලෙස ඇස්තමේන්තුගත කර ඇත.

**අවශ්‍යවන්නේ:**

'LKAS 1- මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම' ප්‍රමිතයට අනුව ප්‍රසිද්ධ කිරීම සඳහා සීමිත දමිත පොදු සමාගමේ පහත මූල්‍ය ප්‍රකාශන (සටහන් ද ඇතුළුව):

(1) 2022.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තීරණ ආදායම් ප්‍රකාශනය

(2) 2022.03.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

(3) 2022.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය **(මුළු ලකුණු 40 යි)**

**2. (අ)** සීමිත අනුරාධා (පෞද්ගලික) සමාගම ගඩොල් නිෂ්පාදනය කිරීමේ නිරත වන ආයතනයකි. පහත තොරතුරු 2022 මාර්තු මාසය සඳහා ගඩොල් නිෂ්පාදනය කිරීමේදී භාවිත කරනු ලබන අමුද්‍රව්‍යයකට අදාළ වේ.

| දිනය | විස්තරය | ප්‍රමාණය (කිලෝ ග්‍රෑම්) | කිලෝ ග්‍රෑමයක මිල |
|---|---|---|---|
| 01 | ආරම්භක අමුද්‍රව්‍ය තොගය | 5 000 | රු. 25 |
| 10 | අමුද්‍රව්‍ය ගැනුම් | 20 000 | රු. 30 |
| 15 | ගඩොල් නිෂ්පාදනය කිරීම සඳහා නිකුත් කළ අමුද්‍රව්‍ය | 16 000 | ? |
| 20 | අමුද්‍රව්‍ය ගැනුම් | 30 000 | රු. 40 |
| 28 | ගඩොල් නිෂ්පාදනය කිරීම සඳහා නිකුත් කළ අමුද්‍රව්‍ය | 10 000 | ? |

**අවශ්‍යවන්නේ:**

2022 මාර්තු මාසය සඳහා පහත එක් එක් ක්‍රමය පදනම්ව මෙම අමුද්‍රව්‍ය සඳහා ගබඩා ලෙජර් ගිණුම:

(1) පෙර-පිවිසි පෙර-පිට (FIFO) ක්‍රමය

(2) භරිත සාමාන්‍ය පිරිවැය (WAC) ක්‍රමය **(ලකුණු 16 යි)**

/හතරවැනි පිටුව බලන්න.

(ආ) නිෂ්පාදන සමාගමක් විසින් 'X' සහ 'Y' නම් වූ භාණ්ඩ දෙකක් නිෂ්පාදනය කරනු ලැබේ. මෙම භාණ්ඩ නිෂ්පාදනය කිරීම සඳහා 'එකලස්' සහ 'නිමැවුම්' නම් වූ නිෂ්පාදන පිරිවැය මධ්‍යස්ථාන දෙකක් සහ 'ගබඩාව' යන සේවා පිරිවැය මධ්‍යස්ථානය සමාගම විසින් භාවිත කරනු ලබයි. මෙම සියලුම පිරිවැය මධ්‍යස්ථාන එකම පරිශ්‍රයක පිහිටා ඇත. ඉදිරි මූල්‍ය වර්ෂය සඳහා අයවැයගත නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය පහත දී ඇත.

| | රු.'000 |
|---|---|
| **ප්‍රතිපාදනය කරන ලද පොදුකාර්ය පිරිවැය:** | |
| එකලස් | 930 |
| නිමැවුම් | 760 |
| ගබඩාව | 40 |
| **වෙනත් පොදුකාර්ය පිරිවැය:** | |
| කර්මාන්තශාලා කුලිය | 100 |
| විදුලිය | 300 |
| යන්ත්‍ර ක්ෂය | 450 |
| තොරතුරු පද්ධතියේ නඩත්තු පිරිවැය | 420 |

**අතිරේක තොරතුරු:**

(i) පිරිවැය මධ්‍යස්ථානවලට අදාළ තොරතුරු:

| | **එකලස්** | **නිමැවුම්** | **ගබඩාව** |
|---|---|---|---|
| කිලෝවොට් පැය | 10 000 | 8 000 | 2 000 |
| යන්ත්‍ර පිරිවැය (රු.'000) | 80 | 40 | — |
| භූමි ප්‍රමාණය (වර්ග මීටර) | 1 500 | 750 | 250 |
| තොරතුරු පද්ධතිය මගින් ජනනය කරනු ලබන වාර්තා සංඛ්‍යාව | 50 | 150 | 10 |

(ii) එකලස් සහ නිමැවුම් පිරිවැය මධ්‍යස්ථානවලට පිළිවෙළින් 3:2 අනුපාතයට ගබඩාවේ සේවය සපයනු ලබයි.

(iii) එකලස් සහ නිමැවුම් පිරිවැය මධ්‍යස්ථාවල පොදුකාර්ය පිරිවැය පිළිවෙළින් යන්ත්‍ර පැය සහ ශ්‍රම පැය මත භාණ්ඩවලට අනතර්ග්‍රහණය කරනු ලබයි. එකලස් පිරිවැය මධ්‍යස්ථානයේ අයවැයගත යන්ත්‍ර පැය ගණන 40 000 ක් වන අතර, නිමැවුම් පිරිවැය මධ්‍යස්ථානයේ අයවැයගත ශ්‍රම පැය ගණන 20 000 ක් වේ.

(iv) වර්ෂයක් තුළදී සමාගම විසින් නිෂ්පාදනය කරන ලද භාණ්ඩ සඳහා පහත තොරතුරු අදාළ වේ.

| | **X භාණ්ඩය** | **Y භාණ්ඩය** |
|---|---|---|
| ඒකකයක් සඳහා සෘජු අමුද්‍රව්‍ය පිරිවැය (රු.) | 310 | 340 |
| ඒකකයක් සඳහා සෘජු වේතන (රු.) | 150 | 200 |
| ඒකකයක් නිෂ්පාදනය කිරීම සඳහා සත්‍ය පැය ගණන: | | |
| - යන්ත්‍ර පැය | 5 | 2 |
| - ශ්‍රම පැය | 2 | 4 |
| නිෂ්පාදනය කළ ඒකක සංඛ්‍යාව | 1 000 | 1 500 |

(v) භාණ්ඩවල විකුණුම් මිල පහත පරිදි තීරණය කරනු ලැබේ.

- X භාණ්ඩය – ඒකකයක නිෂ්පාදන පිරිවැය මත 20% ක ලාභයක් තබා ගනිමින්
- Y භාණ්ඩය – ඒකකයක විකුණුම් මිල මත 10% ක ලාභ ආන්තිකයක් තබා ගනිමින්

**අවශ්‍යවන්නේ:**

(1) විභජන පදනම් පැහැදිලිව දක්වමින් පොදුකාර්ය පිරිවැය විශ්ලේෂණ පත්‍රිකාව (ගබඩාවෙහි පොදුකාර්ය පිරිවැය නැවත විභජනය ද ඇතුළත්ව)

(2) එක් එක් නිෂ්පාදන පිරිවැය මධ්‍යස්ථානය සඳහා පොදුකාර්ය පිරිවැය අන්තර්ග්‍රහණ අනුපාතය

(3) 'X' සහ 'Y' භාණ්ඩ සඳහා පහත ඈ:

(i) ඒකකයක් සඳහා නිෂ්පාදන පිරිවැය

(ii) ඒකකයක් සඳහා විකුණුම් මිල **(ලකුණු 24 යි)**

**(මුළු ලකුණු 40 යි)**

[පස්වැනි පිටුව බලන්න.

**3.** **(අ)** කරුණා එන්ටර්ප්‍රයිසස් සිල්ලර වෙළෙඳ ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබයි. මෙම ව්‍යාපාරයේ 2022.03.01 දිනට ආරම්භක ශේෂයන් සහ 2022 මාර්තු මාසය තුළදී සිදු කරන ලද ගනුදෙනු ගිණුම්කරණ සමීකරණයක ආකාරයෙන් පහත දක්වා ඇත.

(රු.'000)

| ශේෂය/ ගනුදෙනු අංකය | වත්කම් | | | = | වගකීම් + | | හිමිකම |
|---|---|---|---|---|---|---|---|
| | කාර්යාල උපකරණ | තොගය | වෙළෙඳ ණයගැතියෝ | මුදල් | වෙළෙඳ ණයහිමියෝ | බැංකු ණය | |
| ආරම්භක ශේෂය | 500 | 750 | 60 | 600 | 150 | 400 | 1 360 |
| 1 | +100 | | | -100 | | | |
| 2 | | +160 | | | +160 | | |
| 3 | | -350 | | +500 | | | +150 |
| 4 | | -300 | +400 | | | | +100 |
| 5 | | | | -150 | | -130 | -20 |
| 6 | | | | -140 | -150 | | +10 |
| 7 | | | -60 | +50 | | | -10 |
| 8 | | +200 | | -60 | +140 | | |
| 9 | | -170 | +160 | +30 | | | +20 |
| 10 | +200 | | | | | | +200 |
| 11 | | -60 | | | | | -60 |
| 12 | -100 | | | +150 | | | +50 |
| අවසාන ශේෂය | 700 | 230 | 560 | 880 | 300 | 270 | 1 800 |

**අවශ්‍යවන්නේ:**

(1) ඉහත අංක 1 සිට 12 දක්වා ඇති වටිනාකම් තුළින් නිරූපණය කෙරෙන ගනුදෙනු (අගයන් ද සහිතව) ලියා දක්වන්න (2022 මාර්තු මාසය තුළදී තොග පරිත්‍යාග, හානිවීම් හෝ කපා හැරීම් නොමැති බව සලකන්න)

(2) ශුද්ධ වත්කම් පදනම භාවිත කරමින් 2022 මාර්තු මාසය සඳහා ලාභය හෝ අලාභය

(3) 2022 මාර්තු මාසය සඳහා හඳුනාගත යුතු විකුණුම් අයභාරය සහ මුළු ආදායම **(ලකුණු 30 යි)**

**(ආ)** විදුමිණි සංගමය ග්‍රාමීය ප්‍රදේශවල අධ්‍යාපන කටයුතු ප්‍රවර්ධනය සඳහා පිහිටුවන ලද සුබසාධක සංගමයකි. මෙම සංගමයේ සාමාජිකයෙකුගේ මාසික සාමාජික ගාස්තුව රු. 2 000 කි. 2022.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මෙම සංගමයේ සාමාජික මුදල්වලට පහත තොරතුරු අදාළ වේ.

(i) 2022.01.01 දිනට සංගමයේ සිටි සාමාජික සංඛ්‍යාව 240 ක් වූ අතර, ඔවුන්ගේ සාමාජික මුදල් ගෙවීම් පහත පරිදි වේ.

- 2022.01.01 දිනට සාමාජිකයන් 35 දෙනෙකුගේ මාස 03 ක් සඳහා සාමාජික මුදල් හිඟව තිබුණි. ඔවුන්ගෙන් 25 දෙනෙකු මෙම හිඟහිටි සාමාජික මුදල් සහ 2022 වර්ෂයේ සම්පූර්ණ සාමාජික මුදල ප්‍රවර්තන වර්ෂය තුළදී ගෙවන ලදී. ඉතිරි සාමාජිකයන් 10 දෙනා, 2021 වර්ෂයේ හිඟහිටි සාමාජික මුදල සහ 2022 සම්පූර්ණ වර්ෂය සඳහාම සාමාජික මුදල් ගෙවා නොමැත. මීට අමතරව තවත් සාමාජිකයන් 30 දෙනෙකු 2022 සම්පූර්ණ වර්ෂය සඳහාම සාමාජික මුදල් ගෙවා නොමැත.
- 2021 දෙසැම්බර් මාසය තුළදී සාමාජිකයන් 50 දෙනෙකු විසින් 2022 සම්පූර්ණ වර්ෂයම සඳහා සාමාජික මුදල් ගෙවා තිබුණි. තවද, 2022 දෙසැම්බර් මාසය තුළදී සාමාජිකයන් 30 දෙනෙකු විසින් 2023 වර්ෂයේ ප්‍රථම මාස 03 සඳහා සාමාජික මුදල් ගෙවන ලදී.
- අනෙකුත් සාමාජිකයන් ප්‍රවර්තන වර්ෂයේ සාමාජික මුදල් නිසි පරිදි ගෙවා ඇත.

(ii) 2022.07.01 දින නව සාමාජිකයන් 60 දෙනෙකු මෙම සංගමයට බැඳුණි. ඔවුන්ගෙන් සාමාජිකයන් 40 දෙනෙකු විසින් මාස 06 ක් වූ මුළු කාලපරිච්ඡේදය සඳහාම සාමාජික මුදල් ගෙවන ලදී. ඉතිරි සාමාජිකයන් 20 දෙනා විසින් 2022.12.31 දින වනවිට සාමාජික මුදල් ගෙවා තිබුණේ මාස 05 කට පමණි.

**අවශ්‍යවන්නේ:**

2022.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සාමාජික මුදල් ගිණුම **(ලකුණු 10 යි)**

**(මුළු ලකුණු 40 යි)**

**4. (අ)** සීමිත මලිත් (පෞද්ගලික) සමාගම සැපයුම්කරුවන්ගෙන් කිරි ආශ්‍රිත නිෂ්පාදිත මිල දී ගෙන සිල්ලර වෙළෙඳසැල්වලට විකුණනු ලබයි. කිරි නිෂ්පාදිත සැපයුම්කරුවන් මෙන්ම සීමිත මලිත් (පෞද්ගලික) සමාගම ද එකතු කළ අගය මත බදු (VAT) සඳහා ලියාපදිංචි වී ඇත.

2022 මාර්තු මාසය සඳහා සීමිත මලිත් (පෞද්ගලික) සමාගමට පහත තොරතුරු අදාළ වේ.

(i) 2022.03.01 දිනට ශේෂ:

| | රු.'000 |
|---|---|
| ණයහිමි පාලන ගිණුම | 550 |
| ණයගැති පාලන ගිණුම | 640 |
| මුදල් ගිණුම | 150 |
| VAT පාලන ගිණුම (ගෙවිය යුතු) | 30 |

(ii) 2022.03.01 දිනට ණයහිමියන්ට ගෙවිය යුතු මුදල සහ ගෙවිය යුතු VAT, පිළිවෙළින් චෙක්පත් අංක 160 සහ 161 මගින් 2022.03.10 දින පියවන ලදී. තවද, 2022.03.01 දිනට ණයගැතියන්ගෙන් ලැබිය යුතු මුදල 2022.03.08 දින ලැබුණු අතර, එම මුදල එදිනම බැංකුවේ තැන්පත් කරන ලදී.

(iii) සමාගම විසින් රු. 1 120 000 ක (රු. 120 000 ක VAT සහිතව) කිරි ආශ්‍රිත නිෂ්පාදිත 2022.03.05 දින සැපයුම්කරුවන්ගෙන් ණයට මිල දී ගන්නා ලදී. සමාගම විසින් සැපයුම්කරුවකුට රු. 560 000 ක් චෙක්පත් අංක 162 මගින් 2022.03.25 දින ගෙවන ලදී.

(iv) 2022 මාර්තු මාසයේ ණයට විකුණුම්වලට අදාළ තොරතුරු පහත පරිදි වේ.

| සිල්ලර වෙළෙඳසැල | විකුණුම් දිනය | විකුණුම් (රු.'000) | විකුණුම් තුළ අඩංගු VAT (රු.'000) | මුදල් ලද දිනය | මුදල් ලැබීම් (රු.'000) | දුන් වට්ටම් (රු.'000) | චෙක්පත් අංකය |
|---|---|---|---|---|---|---|---|
| ලක්සිරි | 12 | 672 | 72 | 20 | 612 | 60 | 156 |
| ශාන්ත | 15 | 336 | 36 | 30 | 336 | — | 480 |
| නිල්මිණි | 28 | 1 108 | 108 | — | — | — | — |
| **එකතුව** | | **2 116** | **216** | | **948** | **60** | |

(v) 2022.03.22 දින සමාගම විසින් කිරි ආශ්‍රිත නිෂ්පාදිත රු. 84 000 කට (රු. 9 000 ක VAT සහිතව) අත්පිට මුදලට විකුණන ලද අතර, එදිනම එම මුදල බැංකුවේ තැන්පත් කරන ලදී.

(vi) 2022 මාර්තු මාසය සඳහා මෙහෙයුම් වියදම් රු. 200 000 කි. මෙය තුළ දේපළ, පිරියත සහ උපකරණ ක්ෂය රු. 40 000 ක් ඇතුළත් වේ. ඉතිරි මෙහෙයුම් වියදම් 2022.03.30 දින චෙක්පත් අංක 163 මගින් ගෙවන ලදී. (මෙහෙයුම් වියදම් සඳහා VAT නොසලකා හරින්න.)

(vii) 2022 මාර්තු මාසය සඳහා බැංකු ප්‍රකාශනය 2022.04.05 දින ලැබුණි. 2022.03.31 දිනට බැංකු ප්‍රකාශනයේ ශේෂය එදිනට මුදල් ගිණුමේ ශේෂය සමග එකග නොවී ය. බැංකු ප්‍රකාශනයේ සාරාංශගත තොරතුරු පහත දී ඇත.

| විස්තරය | හර (රු.'000) | බැර (රු.'000) |
|---|---|---|
| 2022.03.01 දිනට ශේෂය | | 150 |
| මුදල් තැන්පතු | | 640 |
| චෙක්පත් අංක 156 | | 612 |
| මුදල් තැන්පතු | | 84 |
| චෙක්පත් අංක 160 | 550 | |
| චෙක්පත් අංක 161 | 30 | |
| චෙක්පත් අංක 162 | 560 | |
| ස්ථාවර නියෝග ගෙවීම් - ණය පොලී | 20 | |
| ස්ථාවර තැන්පතුව මත පොලී | | 100 |
| බැංකු ගාස්තු | 5 | |
| 2022.03.31 දිනට ශේෂය | | 421 |

(viii) මූලික සටහන් පොත්වල එකතුන් මාසිකව පොදු ලෙජරයේ ගිණුම්වලට පිටපත් කරනු ලබයි. ස්ථාවර නියෝග ගෙවීම්, ස්ථාවර තැන්පතු මත පොලී සහ බැංකු ගාස්තු, මුදල් ගිණුමේ සටහන් කරනු ලබන්නේ සමාගමට බැංකු ප්‍රකාශනය ලැබුණු පසුව ය.

/හත්වැනි පිටුව බලන්න.

**අවශ්‍යවන්නේ:**

(1) 2022 මාර්තු මාසය සඳහා පහත මූලික සටහන් පොත්:

(i) මුදල් ලැබීම් ජර්නලය

(ii) මුදල් ගෙවීම් ජර්නලය

(2) 2022 මාර්තු මාසය සඳහා පහත ලෙජර ගිණුම්:

(i) මුදල් ගිණුම

(ii) ණයගැති පාලන ගිණුම

(iii) ණයහිමි පාලන ගිණුම

(iv) VAT පාලන ගිණුම

(3) බැංකු සැසඳුම් ප්‍රකාශනය (සංශෝධිත මුදල් ශේෂයෙන් ආරම්භ කරන්න.) **(ලකුණු 30 යි)**

**(ආ)** සීමිත අමල් පොදු සමාගම දේශීය වෙළෙඳපොළ සඳහා ඖෂධ නිෂ්පාදනය කරනු ලබයි. නිෂ්පාදන ක්‍රියාවලිය කාර්යක්ෂම කිරීම සඳහා සමාගම විසින් පැරණි යන්ත්‍රයක් වෙනුවට නව යන්ත්‍රයක් යොදා ගැනීමේ ව්‍යාපෘතියක් සලකා බලමින් සිටී.

නව යන්ත්‍රයේ ඇස්තමේන්තුගත මිල රු. 2 800 000 කි. එහි අපේක්ෂිත ඵලදායී ජීවකාලය සහ ඇස්තමේන්තුගත සුන්බුන් අගය පිළිවෙළින් වර්ෂ 5 ක් සහ රු. 450 000 ක් වේ. තවද, නව යන්ත්‍රය ප්‍රවාහනය සහ ප්‍රතිෂ්ඨාපනය කිරීම සඳහා රු. 200 000 ක් දැරීමට සිදුවනු ඇත. නව යන්ත්‍රය මිල දී ගන්නේ නම්, එම අවස්ථාවේදී පැරණි යන්ත්‍රය රු. 800 000 කට විකිණිය හැකි ය.

මෙම ව්‍යාපෘතියේ අනෙකුත් මුදල් ප්‍රවාහ ඇස්තමේන්තු පහත පරිදි වේ.

(i) ව්‍යාපෘතිය ආරම්භයේදී අතිරේක කාරක ප්‍රාග්ධන අවශ්‍යතාවය රු. 300 000 ක් වන අතර, එය ව්‍යාපෘතිය අවසානයේදී අයකරගත හැකි ය.

(ii) මෙහෙයුම් වියදම් රු. 200 000 කින් වාර්ෂිකව අඩුවනු ඇත.

(iii) විකුණුම් අයභාරය රු. 400 000 කින් වාර්ෂිකව වැඩිවනු ඇත.

මෙම ව්‍යාපෘතියේ අපේක්ෂිත ප්‍රතිලාභ අනුපාතය 10% ක් වන අතර, එහි වට්ටම් සාධක පහත පරිදි වේ.

| වසර | 1 | 2 | 3 | 4 | 5 |
|---|---|---|---|---|---|
| වට්ටම් සාධකය (ආසන්න දශම ස්ථාන දෙකකට) | 0.91 | 0.83 | 0.75 | 0.68 | 0.62 |

**අවශ්‍යවන්නේ:**

(1) ව්‍යාපෘතියේ එක් එක් වර්ෂය සඳහා මුදල් ගලාඒම් සහ මුදල් ගලායාම් ලේඛනය

(2) ව්‍යාපෘතියේ ශුද්ධ වර්මාන අගය (NPV)

(3) ශුද්ධ වර්තමාන අගය පදනම්ව නව යන්ත්‍රය මිල දී ගැනීම සඳහා නිර්දේශය **(ලකුණු 10 යි)**

**(මුළු ලකුණු 40 යි)**

5. (අ) 2021.04.01 දිනට අමා, භානු සහ ජයනි හවුල් ව්‍යාපාරයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙන් පහත ශේෂ උපුටා ගන්නා ලදී.

| හවුල්කරු | ප්‍රාග්ධන ගිණුම් (රු.'000) | ජංගම ගිණුම් (රු.'000) | ණය ගිණුම් (රු.'000) |
|---|---|---|---|
| අමා | 10 000 | 2 000 | 4 000 |
| භානු | 8 000 | 1 000 | — |
| ජයනි | 6 000 | 600 | — |

**අතිරේක තොරතුරු:**

(i) හවුල් ව්‍යාපාර ගිවිසුමේ කොන්දේසි පහත පරිදි වේ.

- අමා, භානු සහ ජයනි අතර ලාභාලාභ බෙදාගැනීමේ අනුපාතය පිළිවෙළින් 3:2:1කි.
- සෑම හවුල්කරුවෙකුම රු. 1 200 000 ක වාර්ෂික වේතනයකට හිමිකම් ලබයි.
- සෑම හවුල්කරුවෙකුම වර්ෂයේ ආරම්භක ප්‍රාග්ධන ශේෂය මත 10% ක වාර්ෂික පොලියකට හිමිකම් ලබයි.
- සපයන ලද ණය සඳහා හවුල්කරුවෙකු 6% ක වාර්ෂික පොලියකට හිමිකම් ලබන අතර, එය හවුල්කරුවන්ගේ ජංගම ගිණුම් තුළින් ගළපනු ලබයි.

[අටවැනි පිටුව බලන්න.

(ii) 2022.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හවුල් ව්‍යාපාරයේ විකුණුම් අයභාරය සහ විකුණුම් පිරිවැය පිළිවෙළින් රු. 30 000 000 ක් සහ රු. 19 000 000 ක් විය.

(iii) 2022.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හවුල් ව්‍යාපාරයේ මෙහෙයුම් වියදම් රු. 5 000 000 ක් විය.

(iv) භානු විසින් ප්‍රවර්තන වර්ෂය තුළදී පෞද්ගලික පරිභරණය සඳහා හවුල් ව්‍යාපාරයෙන් ලබාගත් භාණ්ඩවල පිරිවැය රු. 400 000 ක් වූ අතර, එය පොත්වල සටහන් කර නොමැත. කෙසේ වුව ද, විකුණුම් පිරිවැය ගණනය කිරීම සඳහා 2022.03.31 දිනට තොගය අගය කරන ලද්දේ භෞතික ගණනය මත ය.

(v) ප්‍රවර්තන වර්ෂය තුළදී සියලු හවුල්කරුවන්ට රු. 1 000 000 බැගින් වේතන ගෙවා ඇති අතර, එම ගෙවීම් වැරදීමකින් හවුල් ව්‍යාපාරයේ මෙහෙයුම් වියදම් තුළ ඇතුළත් කර ඇත.

(vi) 2022.03.01 දින ජයනිට අයිති ඉඩමක් හවුල් ව්‍යාපාරයට රු. 115 000 ක මාසික කුලියකට ලබා දී ඇත. මෙම කුලිය ගෙවා හෝ ගිණුම්ගත කර හෝ නොමැත.

(vii) අමාගේ ණය ශේෂයෙන් 75% ක් 2021.12.31 දින, මෙදින දක්වා වූ පොලියද සමග පියවන ලදී.

(viii) 2022.03.31 දින ජයනි හවුල් ව්‍යාපාරයෙන් විශ්‍රාම ගන්නා ලදී. මෙදිනට හවුල් ව්‍යාපාරයේ කීර්තිනාමය රු. 6 000 000 ක් ලෙස ඇස්තමේන්තු කරන ලද අතර, එය හවුල් ව්‍යාපාරයේ පොත්වල ගැළපිය යුතු වේ. අමා සහ භානු පිළිවෙළින් 3:2 අනුපාතයට ලාභාලාභ බෙදාගනිමින් හවුල් ව්‍යාපාරය පවත්වාගෙන යෑමට එකඟ විය.

(ix) අනෙකුත් හවුල්කරුවන්ගේ කැමැත්ත මත ව්‍යාපාරයේ මෝටර් රථයක් එහි ධාරණ වටිනාකම වූ රු. 1 200 000 කට 2022.03.31 දින ජයනිට පවරාදෙන ලදී. ජයනිට ගෙවිය යුතු ඉතිරි මුදල, ණය ගිණුමකට මාරු කරන ලදී.

(x) ජයනිගේ විශ්‍රාම යාමට අදාළ සියලු ගැළපීම්, ප්‍රාග්ධන ගිණුම් තුළින් සිදුකළ යුතු ය.

**අවශ්‍යවන්නේ:**

(1) 2022.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හවුල් ව්‍යාපාරයේ ආදායම් ප්‍රකාශනය (හවුල්කරුවන්ට කරන ලද විසර්ජනයන්ද ඇතුළත්ව)

(2) 2022.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ප්‍රාග්ධන ගිණුම් සහ ජංගම ගිණුම් **(ලකුණු 22 යි)**

**(ආ)** පහත තොරතුරු සීමිත නෙත්මි පොදු සමාගමේ මූල්‍ය ප්‍රකාශනවලින් උපුටා ගන්නා ලදී.

| | රු.'000 |
|---|---|
| **2022.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා:** | |
| විකුණුම් | 9 000 |
| දළ ලාභය | 3 200 |
| මෙහෙයුම් වියදම් | 1 200 |
| පොළී වියදම් | 200 |
| වර්ෂය සඳහා ආදායම් බදු වියදම් | 450 |
| සාමාන්‍ය කොටස්හිමියන්ට ගෙවූ අතුරු ලාභාංශ | 300 |
| **2022.03.31 දිනට:** | |
| තොගය | 1 100 |
| වෙළෙඳ ණයගැතියෝ | 1 400 |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය - සාමාන්‍ය කොටස් (කොටස් ගණන -150 000) | 3 000 |

**අතිරේක තොරතුරු:**

(i) සියලු විකුණුම් ණය පදනමට සිදු කෙරේ.

(ii) 2021.04.01 දිනට තොගය රු. 900 000 ක් විය.

(iii) 2021.04.01 දිනට වෙළෙඳ ණයගැතියෝ රු. 1 600 000 ක් විය.

(iv) 2021.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා තෝරාගත් අනුපාත කිහිපයක් පහත පරිදි වේ.

| | |
|---|---|
| – දළ ලාභ අනුපාතය | 38% |
| – ශුද්ධ ලාභ අනුපාතය | 12.5% |
| – තොග පිරිවැටුම් අනුපාතය | වාර 6 |
| – ණයගැති පිරිවැටුම් අනුපාතය | වාර 5.5 |
| – කොටසක ඉපැයුම | රු. 7.50 |
| – කොටසක ලාභාංශය | රු. 2.50 |

[නවවැනි පිටුව බලන්න.

**අවශ්‍යවන්නේ:**

(1) 2022.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත අනුපාත:

(i) දළ ලාභ අනුපාතය

(ii) ශුද්ධ ලාභ අනුපාතය

(iii) තොග පිරිවැටුම් අනුපාතය

(iv) ණයගැති පිරිවැටුම් අනුපාතය

(v) කොටසක ඉපැයුම

(vi) කොටසක ලාභාංශය

(2) ඉහත (1) කොටසේ ගණනය කරන ලද එක් එක් අනුපාතය පසුගිය වර්ෂයේ අනුපාත සමග සංසන්දනය කරමින් ඒවායේ වෙනස්වීම, වාසිදායකද අවාසිදායකද යන්න සඳහන් කරන්න. **(ලකුණු 18 යි)**

**(මුළු ලකුණු 40 යි)**

**6.** **(අ)** සීමිත ලහිරු පොදු සමාගමේ 2022.03.31 දිනට සහ 2021.03.31 දිනට ප්‍රසිද්ධ කරන ලද මූල්‍ය තත්ත්ව ප්‍රකාශනවලින් පහත තොරතුරු උපුටා ගන්නා ලදී.

| | **2022.03.31 දිනට (රු.'000)** | **2021.03.31 දිනට (රු.'000)** |
|---|---|---|
| දේපළ, පිරියත සහ උපකරණ - ධාරණ වටිනාකම .......... | 275 000 | 245 000 |
| මුදල් සහ මුදල් සමාන දෑ .......... | 8 050 | 1 500 |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය - සාමාන්‍ය කොටස් .......... | 285 000 | 200 000 |
| ප්‍රත්‍යාගණන සංචිතය - ඉඩම් හා ගොඩනැගිලි .......... | 13 500 | 8 000 |
| දිගුකාලීන බැංකු ණය .......... | 135 000 | 125 000 |
| ගෙවිය යුතු ආදායම් බදු .......... | 6 500 | 7 250 |

**අතිරේක තොරතුරු:**

(i) 2022.03.31 දිනෙන් අවසන් වර්ෂය තුළදී ගනුදෙනුකරුවන්ගෙන් එකතු කරගත් මුදල් රු. 245 000 000 ක් වූ අතර, සැපයුම්කරුවන්ට සහ සේවකයන්ට ගෙවූ මුදල් රු. 235 000 000 ක් විය.

(ii) 2022.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ක්ෂය සහ ආදායම් බදු වියදම් පිළිවෙළින් රු. 35 000 000 ක් සහ රු. 15 000 000 ක් විය.

(iii) 2022.03.31 දිනෙන් අවසන් වර්ෂය තුළදී සමාගම විසින් රු. 35 000 000 ක බැංකු ණය වාරිකයක් ගෙවූ අතර, එය තුළ රු. 8 500 000 ක පොලියක් අඩංගු විය. තවද නව ණය මුදලක් 2022.03.31 දින ලබා ගන්නා ලදී.

(iv) 2022.03.31 දින ඉඩම් සහ ගොඩනැගිලි දෙවන වරට ප්‍රත්‍යාගණනය කිරීමෙන් ඇති වූ අතිරික්තය ප්‍රත්‍යාගණන සංචිතයේ වැඩිවීම මඟින් නිරූපණය කරනු ලබයි.

(v) 2022.03.31 දින යන්ත්‍රයක් විකිණීමෙන් ඇති වූ අලාභය රු. 2 500 000 ක් විය. මෙම යන්ත්‍රය 2020.04.01 දින රු. 20 000 000 කට මිල දී ගත් අතර එය සරල මාර්ග ක්‍රමය මත වාර්ෂිකව 10% බැගින් ක්ෂය කරන ලදී.

(vi) 2022.03.31 දින සමාගම විසින් මෝටර් රථයක් අත්පිට මුදලට මිල දී ගන්නා ලදී.

(vii) 2021.10.01 දින සමාගම විසින් රු. 10 000 000 ක රඳවාගත් ඉපැයුම් ප්‍රාග්ධනිත කරන ලදී. තවද සමාගම විසින් 2022.01.01 දින මහජන කොටස් නිකුතුවක් සිදු කරන ලද අතර, නිකුත් කළ සියලු කොටස් සඳහා මුදල් 2022 ජනවාරි මාසය තුළදී එකතු කර ගන්නා ලදී.

(viii) 2022.03.31 දිනෙන් අවසන් වර්ෂය තුළදී සාමාන්‍ය කොටස්හිමියන්ට රු. 2 200 000 ක අතුරු ලාභාංශයක් ගෙවන ලදී.

**අවශ්‍යවන්නේ:**

'LKAS 7 - මුදල් ප්‍රවාහ ප්‍රකාශනය' ප්‍රමිතයට අනුව 2022.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සීමිත ලහිරු පොදු සමාගමේ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය **(ලකුණු 20 යි)**

[දහවැනි පිටුව බලන්න.

(ආ) ස්ටීවන් විසින් කුලියට ගන්නා ලද වෑන් රථයක් යොදාගනිමින් යාපනයේ සිට කටුනායක ගුවන් තොටුපළට මගීන් ප්‍රවාහනය කිරීමේ සේවාවක් ආරම්භ කිරීමට සැලසුම් කරමින් සිටී. යාපනයේ සිට කටුනායක ගුවන් තොටුපළට පැමිණ නැවත යාපනයට යාම, එක් ගමන් වාරයක් ලෙස සලකනු ලබයි. එක් ගමන් වාරයක් සඳහා රු. 100 000 ක ගාස්තුවක් අය කිරීමට අපේක්ෂා කරයි.

මෙම ප්‍රවාහන සේවාවේ ඇස්තමේන්තුගත පිරිවැය පහත පරිදි වේ.

| | | |
|---|---|---|
| වාහනය සඳහා කුලිය | වසරකට රු. | 720 000 |
| වාහනය නඩත්තු කිරීමේ පිරිවැය | වසරකට රු. | 120 000 |
| පරිපාලන පිරිවැය | වසරකට රු. | 240 000 |
| රියදුරුගේ ගාස්තුව | ගමන් වාරයකට රු. | 10 000 |
| රිය සහයකගේ ගාස්තුව | ගමන් වාරයකට රු. | 6 000 |
| රියදුරු සහ රිය සහයක සඳහා ආහාර පාන පිරිවැය | ගමන් වාරයකට රු. | 8 000 |
| අධිවේගී මාර්ග ප්‍රවේශපත් පිරිවැය | ගමන් වාරයකට රු. | 2 000 |
| ගමන් වාරයක් සඳහා ඉන්ධන පිරිවැය (ඩීසල් සඳහා) | | ? |

**අතිරේක තොරතුරු:**

(i) යාපනයේ සිට කටුනායක ගුවන් තොටුපළට දුර කිලෝ මීටර 400 කි.

(ii) ඩීසල් ලීටරයක මිල රු. 550 ක් වන අතර, මෙම වාහනය එක් ඩීසල් ලීටරයකින් කිලෝ මීටර් 10 ක් ධාවනය කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

(iii) වාහනය කුලියට ලබාගෙන ඇතත් එහි නඩත්තු කිරීමේ පිරිවැය මෙම ව්‍යාපාරය විසින් දැරිය යුතු වේ.

**අවශ්‍යවන්නේ:**

(1) මෙම ප්‍රවාහන සේවාවේ වාර්ෂික ස්ථාවර පිරිවැය

(2) එක් ගමන් වාරයක් සඳහා විචල්‍ය පිරිවැය

(3) මුළු පිරිවැය ආවරණය කිරීම සඳහා වසරකට සිදුකළ යුතු ගමන් වාර සංඛ්‍යාව

(4) වසරක් තුළ ගමන් වාර 48 ක් සිදුකළහොත් වාර්ෂික ලාභය

(5) පහත කොන්දේසි දෙකම සපුරාලිය හැකිනම් මුළු පිරිවැය ආවරණය කිරීම සඳහා වසරකට සිදුකළ යුතු ගමන් වාර සංඛ්‍යාව:

- ගමන් වාරයක් සඳහා රිය සහයක ගාස්තුව රු. 1 000 කින් අඩුකිරීම සහ
- ගමන් වාරයක් සඳහා අයකරන ගාස්තුව රු. 5 000 කින් වැඩිකිරීම **(ලකුණු 20 යි)**

**(මුළු ලකුණු 40 යි)**

* * *